
# ඵල දරන ජීවිතයක් සඳහා

ජී. ජේ. ඇන්තනි



'දහම් නවෝදය' ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය - 2023 ජනවාරි

මුද්‍රණය :
ස්ටැටි ෆොටෝ (STAT FOTO)
1 වන මහළ,
මීමැඩුම ගොඩනැගිල්ල,
රාජපක්ෂ බ්‍රෝඩ්වේ,
මීගමුව.
031 2233210

# පල දරන ජීවිතයක් සඳහා

ජී. ජේ. ඇන්තනි

'දහම් නවෝදය' ප්‍රකාශනයකි

http://dahamnavodaya.com

ආගම යන්නෙන් මා අදහස් කරන්නේ අප අපේ නිර්මාතෘ හා සමග මුහුණට මුහුණ ලා සිටුවන සියලුම ආගම්වලට ආධාරක වී ඇති ආගම මිස විධිමත් ආගම හෝ පාරම්පරික ආගම නොවේ. එය හිංදු ආගම ඉක්මවා යන අයෙකුගේ ස්වභාවය වෙනස් කරන, නොලිහෙන ආකාරයෙන් කෙනෙකු තුළ වූ සත්‍යයට ඔහු බැඳ තබන, පාරිශුද්ධත්වයට පත් කරන ආගමකි. එය තමා හා තම නිර්මාතෘවරයා අවබෝධ කරගෙන තමා සහ තම නිර්මාතෘවරයා අතර නියම සම්බන්ධකම වටහා ගන්නා තුරු ආත්මය නොඉවසිල්ලෙන් තබන පූර්ණ ප්‍රබෝධය ලබා ගනු වස් ඕනෑම පරිත්‍යාගයක් වැඩි ය යි නොසලකන මනුෂ්‍ය ස්වභාවයේ ස්ථිර සාර අංශය වේ.

-මහත්මා ගාන්ධි-
(ආචාර්ය ශ්‍රී ක්‍රිෂ්ණ ක්‍රිපලානිගේ
'All Men are Brothers' 'එක මවකගේ දරුවෝ' ඇසුරෙනි.)

ඔබ මාගේ සහෝදරයා ය. මම ඔබට ආදරය කරමි. ඔබ ඔබේ පල්ලියේ වැඳුම්-පිදුම් කරනවා දකින්නට, පන්සලේ දණ නමා ගෙන සිටිනවා දකින්නට, දේවස්ථානයේ යාච්ඤා කරනවා දකින්නට, මා කැමතිය. ඔබත් මාත් අපි සියලු දෙනා ම එක ම ආගමක දරුවෝ වෙමු. ඊට හේතුව හැම ආගමක් ම ශ්‍රේෂ්ඨතමයාණන්ගේ අතින් විහිදී ගිය ඇඟිලි වීමය.

(ලෙබනන් ජාතික කවියකු හා දාර්ශනිකයෙකු වූ ඛලිල් ජිබ්රාන්)
(ගුණදාස ලියනගේ 'දෙව්දුරු අරටු' ඇසුරෙනි.)

මේ ගත කරන දිවියෙන් එහා, කාලයට එහා, සියලු මැනීම්වලට එහා වන යම් කිසිවක් ඇද්දැ යි මිනිසා සෑම කල්හී ම සොයා ඇත. සනාතනත්වය, අමරණීයත්වය සත්‍ය ලෙසින් ම අපරමිත වූ අනාමික වූ දෙය- මෙය මිනිසා සොයා ඇත. ---- අතිශයින් පරිශුද්ධ වූ නමක් නොමැති වූ සියල්ලෙහි ප්‍රභවය හා පරම සත්‍යය වනුයේ යමක් ද එය අනාවරණය වීම ය, ආගම යන්නෙහි නියම තේරුම.

-ජේ ක්‍රිෂ්ණමූර්ති-
('මනුෂ්‍ය වර්ගයාගේ කථාන්තරය', (මහාචාර්ය මහින්ද පලිහවඩන)

# පල දරන ජීවිතයක් සඳහා

## 01

පල දරන ජීවිතයක් ගැන කතා කිරීමේදී ඊට පසුබිම් වන කරුණු කීපයක් පිළිබඳව අප පළමුවෙන් සලකා බැලිය යුතුව තිබෙනවා. තුරුණු විය කියන්නෙ කුමක්ද කියන එක එලෙස අප සලකා බැලිය යුතු වැදගත් කරුණක්. බොහෝ දෙනා හිතන්නෙ තුරුණු විය කියද්දි එයින් යම් කිසි වයස් සීමාවකට අයිති අයවලුන් හැඳින්වෙන බවයි. වයස අවුරුදු 16 සිට 35 දක්වා අයවලුන් තුරුණු වියේ අය ලෙසයි, සාමාන්‍ය පිළිගැනීම. තුරුණු විය කියන්නෙ යම් කිසි වයස් සීමාවකට අයිති අයෙකුට වඩා ගුණාංග කීපයක, විශේෂයෙන් ගුණාංග තුනක එකතුවක් හැටියට හඳුන්වන්න පුළුවන්. එඩිතර බව තුරුණු විය හා අත්වැල් බැඳගත් ප්‍රබල ගුණාංගයක්. විවෘතභාවය හෙවත් අව්‍යාජභාවය තුරුණු විය සතු තවත් වටිනා ගුණාංගයක්. එසේම තුරුණු විය සතු විය යුතු අනෙක් වටිනා ගුණාංගය නිර්මාණශීලිභාවය හෙවත් ගවේෂණශීලිභාවයයි.

තරුණ විය යනුවෙන් බොහෝ දෙනා අදහස් කරන යම් කිසි වයස් සීමාවක දි ඒ වයස් සීමාවට අයිති බොහෝ දෙනා තුළ මේ ගුණාංග තුන යම් තරමකට හෝ දක්නට ලැබුනත් රැකියාව හා විවාහය සමග බොහෝ දෙනා තුළින් ඒ ගුණාංග ගිලිහී යාම සංවේගයට කරුණක්. සමාජ ප්‍රගතිය ගැන කල්පනා කිරීමේදී ඒ තත්ත්වය ඛේදවාචකයක් ලෙසයි, අපට පිළිගන්නට සිදුවන්නේ. විවාහය හා රැකියාව සමග බොහෝ දෙනා ඊට පෙර තමාම පහර දුන් දේ වැළඳ ගන්නවා, තමා සුනු විසුනු කරන්නට උත්සාහ කළ දේ නැවත ගොඩනගා ගන්නවා, වැල යන අතටම මැස්ස ගහන්නට ක්‍රියා කරනවා, ප්‍රවාහයට හසුවී ගඟ ගලා යන අතටම ගසා ගෙන යනවා. උඩු ගං බලා පීනුවෙ නැතත් ප්‍රවාහයට, හසුවී ගසා ගෙන නොයන්නට උත්සාහ කරන අය හමුවන්නෙ කලාතුරකින්. සැඩ පහර කපා ගෙන උඩු ගං බලා පීනන අය හරිම දුලබයි. සැබෑ නායකයෙක්, පුරෝගාමියෙක් කියන්නෙ එවැන්නකුටයි. සැඩ පහර කපාගෙන උඩුගං බලා පීනන අය සියයට එකක් හෝ සිටිනව නම් රටක් සමාජයක් කවදාවත් අන්තයටම පිරිහෙන්නෙ නැහැ.

මිනිස් සිරුරක් හෙවත් ශරීරකායක් තිබුණු පමණින් පූර්ණ මනුෂ්‍යයෙක් බිහිවන්නෙ නැහැ කියල අප කවුරුත් දන්නවා. මනුෂ්‍යයාට මනසක් හෙවත් මනෝකායක් තිබෙනවා. මනස හා බැඳුණු සිතුවිලි පරම්පරාවක් හෙවත් චිත්තසන්තානයක් ඔහු සතුව පවතිනවා. එසේම මනුෂ්‍යයාට ඥානයක් හෙවත් ඥානකායක් තිබෙනවා. දැන උගත්කම් තුළින් දිනෙන් දින ඔහු සතු ඥානකාය වැඩෙනවා. මනුෂ්‍යයා පූර්ණ මනුෂ්‍යයෙක් වන්නට නම් ශරීරකාය, මනෝකාය,

ඥානකාය හා අනිවාර්යයෙන් එක්විය යුතු තවත් අංගයක් තිබෙනවා. එය අධ්‍යාත්මකාය හෙවත් ප්‍රඥාකාය ලෙස හඳුන්වන්න පුළුවන්. මේ පූර්ණ මනුෂ්‍යයා සංවර්ධනය වීමෙන් තොරව ඔහු ලබන සැබෑ සංවර්ධනයක් ප්‍රගතියක් නැහැ කියල ස්ථිරයෙන්ම කියන්න පුළුවන්.

කෙනෙක් ජීවිතයේ මැදි වයසට පා තබද්දි, දිවියේ සැඳෑ සමයට පියමං කරද්දි ඔහු සතු ශරීරකාය කෙමෙන් ගෙවෙන්නට දුබල වන්නට පටන් ගන්නවා. එහෙත් කෙනෙකු සතු මනෝකාය, ඥානකාය හා අධ්‍යාත්මකාය ගෙවෙන දෙයක් නොවෙයි, එය කෙමෙන් වැඩෙන දෙයක්. කෙනෙක් මහලු වී සිරුරින් වැහැරී සිටියත් ඔහුගේ මනෝකාය, ඥානකාය හා අධ්‍යාත්මකාය වැඩී, පැසී, පලබර වී ඇත්නම් ඔහු සැබවින්ම මොන තරම් පොහොසත්ද? තරුණයෙක් ශරීරකායෙන් ප්‍රබල තත්ත්වයක සිටින්න පුළුවන්. එහෙත් ඔහු මනෝකාය, ඥානකාය හා අධ්‍යාත්මකාය අතින් තවමත් නොවැඩුණු නොපැසුණු තත්ත්වයකයි සිටින්නේ. එනිසා මනෝකායෙන්, ඥානකායෙන් හා අධ්‍යාත්මකායෙන් පොහොසත් මහල්ලෙකුට ශරීරකායෙන් ප්‍රබල තරුණ පිරිසක් හමුවේ අභිමානයෙන් යුතුව හිස ඔසොවා සිටින්න පුළුවන්. “පැසුණු හිසින් බුහුමන් ලබන්න” කියල අපේ පැරණියන් කිවෙ ඒ නිසා වන්න ඇති.

කෙනෙක් වියපත්ව සිරුරින් ද දුබල වෙද්දි ඔහු මනෝකාය, ඥානකාය හා අධ්‍යාත්මකාය අතින් ද දුබලව සිටින්න පුළුවන්ද? ශු. බයිබලයේ ප්‍රඥා පොතේ 15:12 සඳහන් කරන්නාක් මෙන් ජීවත් වුවහොත් එසේ වන්නට පුළුවන. “ඔහු මේ ජීවිතය සෙල්ලමක් ලෙස සලකයි. මිහිපිට තමාට ලැබෙන කාලය ලාබෙට බඩු ගත හැකි වෙළඳ පොළක් මෙන් සලකයි. කෙතරම් නින්දිත මාර්ගයකින් වේවා මිනිහෙක් තම දිවි පෙවෙත ලබාගත යුතුයි කියා ඔහු පවසයි.” එවැන්නෙක් කොතෙක් ආර්ථිකව බලවත්ව සිටියත් ඔහුගේ මහලු විය ඛේදවාචකයක් වීම කිසිවකුට වළක්වන්නට පුළුවන් දෙයක් නොවෙයි. මා මෙලෙස සඳහන් කළේ මනෝකාය, ඥානකාය හා අධ්‍යාත්මකාය වැඩුණු මහල්ලකු තුළ පවතින සැබෑ ජීවිත අභිමානයෙන් බිඳක් හෝ එවැන්නකු තුළ නොපවතින නිසයි.

යමෙක් වියපත්ව මිය යන තුරු තරුණකමේ උරුමය වන එඩිතරබව, විවෘතභාවය හා නිර්මාණශීලිභාවය රැකගතහොත් ඔහු සදාකාලික යෞවනත්වයක් අත්දුටු අයෙකු ලෙස හඳුන්වා දෙන්න පුළුවන්. රටක මෙවැන්නන්ගේ සංඛ්‍යාව වැඩිවන තරමටයි, ඒ රට වචනයේ පිරිපුන් අරුතින්ම වාසනාවන්ත වන්නේ. එනිසා සදාකාලික යෞවනත්වයක් අත්දැකීමේ රහස කුමක්ද කියල අප විමසා බැලිය යුතුව තිබෙනවා. කෙටියෙන් පැහැදිළිව කියනව නම්, කෙනෙක් තුළ තරුණකමේ උරුමය වන ඒ උතුම් ගුණාංග තුන

වියපත්ව මියයන තුරු ද රැකගත හැකි වන්නේ ඔහු තුළ අධ්‍යාත්මකාය හෙවත් ප්‍රඥාකාය වැඩෙන තරමටයි.

## 02

කෙනෙක් තුළ අධ්‍යාත්මකාය හෙවත් ප්‍රඥාකාය වැඩෙන්නට ආගම් හා උත්තම කලාව යි, මහෝපකාරී වන්නේ. ඒ සඳහා ආගම් විසින් කරන බලපෑම අප මෙහි දී සොයා බලන්න අදහස් කරනවා. ආගම් සියල්ල ශ්‍රේෂ්ඨතමයාණන්ගේ අතින් විහිදෙන ඇඟිලි හැටියට යි, බලිල් පිබ්රාන් විස්තර කරන්නේ. මිනිසා උසස් කරන්නට ක්‍රියා කරන, මිනිස් වර්ගයා ඒකරාශී කිරීම සඳහා අත දෙන සෑම ආගමක්ම අයිති වන්නේ එකම ධර්මකායටයි. එනිසා එවැනි සෑම ආගමක් තුළම ධර්මයාණන් විසින් වපුරා ඇති සත්‍යයේ බීජ හඳුනා ගැනීමත් ඒවා වැඩීම සඳහා අතදීමත් අප සැම සතු වගකීමක්. එහෙත් සෑම ආගම් තුළම සත්‍යය පිළිබඳ අනාවරණයේ යම් යම් සීමා පවතින අතර ඒ එකිනෙක ආගමට හිමි විශේෂ අනන්‍යතාවයක් ද ඇති බව අමතක කරන්න හොඳ නැහැ. කිතු දහම ගැන කියනව නම් මැවුම්කරුවාණන්ම ජේසුස් නමින් මිනිසත් බව ගෙන මෙලොවට පැමිණ කළ අනාවරණය එය නිසා එය දහම පිළිබඳ අනාවරණයේ පරිපූර්ණත්වය ලෙස කිතුනුවන් සලකනවා. (මෙහි මා ආගම් යනුවෙන් අදහස් කරන්නේ ඒවා තුළ ඇති වැඳුම්-පිදුම් ක්‍රම, වත්පිළිවෙත්, ආමිෂ පූජා ආදිය පමණක් නොවේ, ඒ ආගම තුළ ගැබ්ව ඇති ධර්ම ස්කන්ධයයි. මතුපිට නොරැඳී ධර්ම ස්කන්ධයේ ගැඹුරට පිවිසීමයි, සිදුවිය යුත්තේ.)

ථෙරවාදි බුදු දහම මැවුම්කරුවාණන් පිළිබඳ අදහස ප්‍රතික්ෂේප කරනවා. එහෙත් ඔවුන් ද ධර්මකාය හෙවත් ධර්ම ස්කන්ධය ගැන කතා කරනවා. “ධර්මය තුළ ජීවත් වන්නා ධර්මය විසින් රකී” බුදු දහම එලෙස සඳහන් කරනවා. මැවුම්කරුවාණන් පිළිගන්නා ආගම්වලින් සිදුවී ඇත්තේ විශ්ව ශක්තිය, ධර්ම ස්කන්ධය ජීවමාන වූ සර්වබලධාරී වූ තැනැන්වහන්සේ කෙනෙක් බව ප්‍රකාශ කිරීමයි. එසේ ප්‍රකාශ කරන්නේ එය ඔවුන්ට ලැබී ඇති අනාවරණය නිසයි. ඒ අනාවරණය ඔවුන් අත්දැකීමෙන් පසක් කරගෙන තිබෙනවා. මැවුම්කරුවාණන් පිළිගන්නා අනෙකුත් සියලුම ආගම්වලට ද වඩා කිතු දහමේ ඇති විශේෂත්වය කුමක්ද කියල අප සොයා බලන්න ඕනැ. මැවුම්කරුවාණන් වන සියලු බලැති තැනැන්වහන්සේ ප්‍රේමය බවත්, එතුමාණන් සැමගේ ප්‍රේමවන්ත පියාණන් බවත් අප සැම එතුමන්ගේ දූ පුතුන් බවත්, එනිසා අප සැම (මුළු මිනිස් පවුල) සහෝදර සහෝදරියන් බවත්, මැවුම්කරුවාණන් අපට අති සමීප බවත්, එතුමන් අප තුළ වැඩසිටින බවත් කිතු දහම අපට

උගන්වනවා. එසේම මැවුම්කරුවාණන් මිනිසා කෙරෙහි ඇති ප්‍රේමය නිසා ජේසුස් නමින් මිනිස් බව ගෙන මෙලොවට වැඩිය බවත්, එතුමාණන් පාපයෙන් මිදීම හෙවත් ගැළවීම නමැති පලය බිහි කරන්නට තමාම හේතුව වූ බවත්, හෙවත් පාපයේ මිලය වශයෙන් තම ජීවිතය යාගයක් ලෙස පිදූ බවත්, එතුමාණන් මරණයෙන් උත්ථාන වී ප්‍රතාපවත්ව වැඩසිටින බවත්, එතුමන් අත්දුටු, අත්දකින ප්‍රේමවන්ත පුත්‍රභාවයේ අත්දැකීම එතුමාණන් අප හා බෙදා ගන්නා බවත් සැබෑ කිතුනුවකු වීම කියන්නෙ ඒ ප්‍රේමවන්ත පුත්‍රභාවය තමා තුළ පසක්කර ගැනීම බවත් කිතු දහම අපට උගන්වනවා. අසුබ ආරංචිවලින් පිරුන අද ලොවට මෙය සැබවින්ම ශුභාරංචියක් හැටියටයි, කිතු දහම පිළිගන්නේ.

චතුර්විධ ආර්ය මාර්ගය ගැන ථෙරවාදි බුදු දහමේ සඳහන් වෙනවා. යමෙක් සෝවාන් ඵලයට එළඹුනොත් ඔහු, සකෘදාගාමි, අනාගාමි, අරහත් මාර්ගයේ පෙරටම ගමන් කරන බව එහි විස්තර වෙනවා. සෝවාන් ඵලයට පැමිණීම යනු බෞද්ධයෙක් වීමේ නියම මගට පිවිසීමයි. මැවුම්කරුවාණන් පිළිගන්නා සැම ආගමක්ම අධ්‍යාත්මික මාර්ගය ඔස්සේ එහි මුදුනට තමා ගමන් කිරීමකට වඩා එවැනි අරමුණක් කරා තමා මෙහෙයවීමක් හා එහි මුදුන කරා ගෙන යනු ලැබීමක් ගැන පැවසෙනවා.

නාගර්ජුන, ආර්යදේව ආදින් විසින් පෝෂණය කළ මහායාන බුදුදහම ඒ පිළිබඳව කියන්නේ කුමක්ද කියල අපි සොයා බැලිය යුතුව තිබෙනවා. සකල විශ්වය පුරා පැතිර පවත්නා ධර්ම ස්කන්ධයේ සමුච්චිතය ධර්මකාය වන්නා සේ ම එහි මූර්තිය ආදි බුද්ධ මහා විරෝචන බුද්ධ හෙවත් භගවත් වෛරෝචන නමින් හැඳින්වෙනවා. එසේම බුද්ධතාවය විශ්වය පුරා පැතිර පවත්නකැයි ද සැම මනුෂ්‍යයකු තුළම එය නිසර්ගයෙන් පිහිටා ඇතැයි ද මහායානයේ ඉගැන්වෙනවා. එනිසා අප විසින් කළ යුතුව ඇත්තේ බුද්ධතාවය පිරීම, එය වැඩීම, එය ප්‍රගුණ කිරීමයි. එසේ ප්‍රගුණ කිරීමේදී කිසියම් මොහොතක අප තුළ ඇති බුද්ධතාවය පිබිදීමකට ලක්වන බව එහි විස්තර වෙනවා. බුද්ධතාවය පිබිදීම තුළින් ජීවිතයේ අපමණ හැල-හැප්පීම් මැද යහපත අයහපත ජය පරාජය අතරින් ද බුද්ධතාවය වැඩෙමින් අධ්‍යාත්මිකත්වයේ මුදුන කරා ගමන් කරන්නට හැකි වන බව එහි විස්තර වෙනවා. (මහායානය ගැන ඉහත සඳහන් කරුණු විස්තර කිරීමේදී මහාචාර්ය මැන්දිස් රෝහනදීරගේ 'ප්‍රබුද්ධ කාව්‍ය සේවනය' මට උපකාරි වූ බව මා සඳහන් කළ යුතුයි.)

කෙනෙකු තුළ අධ්‍යාත්මකාය වැඩීම පිළිබඳව හිංදු ආගමේ දැක්ම අපි දැන් සොයා බලමු. හිංදු ආගම මනුෂ්‍යයා ආත්ම ලෙසත් මැවුම්කරු පරමාත්ම

ලෙසත් විස්තර කරනවා. මිනිසා පරමාත්මයාණන් කරා දිගු වන්දනා ගමනක යෙදී ඇති බව එහි විස්තර වෙනවා. හිංදු ආගමේ වන්දනා ගමන හැඳින්වෙන්නේ යාත්‍රා යන වචනයෙන්. එය පාද යාත්‍රාවක් හා තිර්ථ යාත්‍රාවක්. උදාහරණයකින් එය තේරුම් ගන්න අපි උත්සාහ කරමු. ජීවිතයේ සතුට රැඳී ඇත්තේ ධනය තුළයි කියල කෙනෙකුට හැඟුනොත් ඔහු ඒ මොහොතේ සිට ධනවතෙක් වීම අරමුණු කොට ගමනක යෙදෙනවා. එය පාද යාත්‍රාවක්. අපි හිතමු, ඔහු ලොකු ධනවතෙක් වුණා කියලා. ඒ ධනවත්කම ඔහුට තිර්ථයක් හෙවත් තොටුපලක්. ඔහු කලක් එහි නැවතී එය වින්දනය කරනවා. ඔහුට අවබෝධ වෙනවා ඔහු සෙවූ සතුට ඒ තුළ ද නැති බව. ඉන්පසු ඔහුට හැඟෙන්න පුළුවන් ඒ සතුට ඇත්තේ විවාහය තුළ කියල. එවිට ඔහු ඒ අරමුණ කරා පාද යාත්‍රාවක යෙදෙනවා. ඔය විදියට ඔහු තිර්ථයකින් තව තිර්ථයක් කරා යමින් අවසන් තිර්ථය හෙවත් තොටුපල වන පරමාත්මයාණන් හමුවන තුරු නොනවතින වන්දනා ගමනක යෙදෙනවා. ජීවිතයේ අපමණ හැල-හැප්පීම් මැද ද සාර්ථකව වන්දනා ගමනේ යෙදෙමින් අධ්‍යාත්මකාය මුහුකුරා යාමට නම් පරමාත්මයාණන් තුළින් ආත්මය පිබිදවීමකට ලක්විය යුතුව තිබෙනවා. එය ජීව පද්මය විකසිත වීම යනුවෙන් හැඳින්වෙනවා.

ඉස්ලාම් ධර්මය ගැනත් වචන ස්වල්පයක් මෙහි සටහන් කරන්න මා කැමතියි. සැබෑ ඉස්ලාම් ආගමිකයෙකුගේ මුවට, හදවතට ඉතා සමීප වචනයක් ඉන්ෂල්ලා යන වචනය. ඉන්ෂා-අල්ලා යනු දෙවියන් වහන්සේ කැමති නම් යන අරුත ප්‍රකාශ කරනවා. මැවුම්කරුවාණන් වහන්සේගේ කැමැත්ත සෙවීම, ඒ කැමැත්ත හැඳිනගැනීම, ඒ කැමැත්ත ඉටු කිරීම ඔවුන්ගේ ද මූලික වගකීමක් බව එයින් පැහැදිලි වෙනවා. අධ්‍යාත්මකාය හෙවත් ප්‍රඥාකාය වැඩීම කෙරෙහි බලපාන මූලික කිතුනු දැක්ම කුමක්ද කියල දැන් අපි සොයා බලමු. ශු. පාවුලු තුමා රෝමවරුන්ට යැවූ සංදේශයේ 8:14 වැකිය එම කිතුනු දැක්ම අපට අනාවරණය කරනවා. "දෙවියන් වහන්සේගේ ආත්මයාණන් විසින් ගෙන යනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද, එපමණ දෙනා දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය." ඒ අනුව සැබෑ කිතුනුවෙක් කියන්නෙ දෙවියන් වහන්සේ තුළ පුත්‍රභාවය, ප්‍රේමවන්ත පුත්‍රභාවය අත්දකින කෙනෙක්. තමා දෙවියන් වහන්සේගේ ප්‍රේමවන්ත පුත්‍රයෙක් බවට ඇති සහතිකය, දෙවියන් වහන්සේගේ ආත්මයාණන් හෙවත් ශුද්ධාත්මයාණන් විසින් මඟ පෙන්වනු ලැබීම, මෙහෙයවනු ලැබීම, ගෙන යනු ලැබීම අත්දැකීමයි. දෙවියන් වහන්සේගේ ප්‍රේමවන්ත පුත්‍රභාවය අත්දැකීමට ඇතුළු වීමට නම් ශුද්ධාත්ම මෙහෙයවීම අත්දකින ජීවිතයකට ඇතුළු වීමට නම් ආත්මය බලගතු දේව ස්පර්ශයකට ලක් විය යුතු වෙනවා. එය ශු. පාවුලු තුමා එපිස 4:30 සඳහන් කරන පරිදි "ශුද්ධාත්මයාණන් තුළ මුද්‍රා කරනු ලැබීමක්" ලෙස හඳුන්වා දෙන්න පුළුවන්. මෙම අත්දැකීමට පිවිසීමත් සමග සෑම සිද්ධින් තුළ සෑම ජීවිත තත්ත්වයන්

තුළ දෙවිඳුන් දෙසම හැරෙන්නට බලයක් ලැබෙනවා. එමගින් දේව ප්‍රඥාවයි අප වෙතට ගලා එන්නේ, එමගිනුයි ප්‍රඥාකාය වැඩෙන්නේ. එවිට සියලු හැල-හැප්පීම්වලට ඔරොත්තු දෙමින් සියල්ලෙන් ධර්ම ඥානය උගනිමින් පෙරටම යන්නට බලය ලැබෙනවා.

"මිදීමේ දවසට ශුද්ධාත්මයාණන් තුළ මුද්‍රා කරනු ලැබීම" අපි උදාහරණයක් ඇසුරෙන් වටහා ගන්නට උත්සාහ කරමු. බෝතල් කුප්පියක් ගඟ දිගේ දිගු ගමනක් ඇවිත් මහා සයුරට ඇතුළු වුණා කියල හිතමු. එහෙම වුණේ ඇයි? ඒ කුප්පිය විවෘතව තිබුණා නම් එහෙම නොවන්න ඉඩ තිබුණා. එවිට එය දිය යටටම ගිලී යනු නිසැකයි. එය ගඟ දිගේ දිගු ගමනක් ඇවිත් මහා සයුරට ඇතුළු වන්නට හැකි වීමේ රහස ඔබට හිතා ගන්න පුළුවන්. මූඩියකින් ආවරණය වීම පමණක් නොවෙයි, එය මුද්‍රා කර තිබීමයි, එයට හේතුව. කුප්පිය ගල්පර අතරේ මාස ගණන් හිරවී තිබෙන්න පුළුවන්. ගඟ දිය සිඳී එක තැන පල්වෙන දුගඳ හමන මඩකඩිත්තක කුප්පියට දිගු කලක් රැඳී ඉන්නට සිදුවන්න පුළුවන්. ඒත් වැස්ස ලැබී ගඟ ගලා යාමට බලය ලබනවා. එම තත්ත්වයන් අපගේ ආත්මික අත්දැකීමට ද අදාළයි. එලෙස ශුද්ධාත්මයාණන් තුළ මුද්‍රා කරනු ලැබූ විට අපමණ බාධක අතරින් ද බිහිසුණු අගාධ අතරින් ද සදාතනය නමැති සයුරට ඇතුළු වීමට බලය ලබනවා. එහෙත් මෙම අධ්‍යාත්මික ගමන අපගේ නිදහස් කැමැත්තට ගරු කරන, පියවරක් පාසා අපගේ නිදහස් කැමැත්තෙන් ප්‍රතිචාරය දීමට සිදුවන ගමනක් බව අමතක නොකරන්න.

## 03

වියපත්ව මියයන තුරා එඩිතරබව, විවෘතභාවය හා ගවේෂණශීලිභාවය රැකගන්නට නම් අධ්‍යාත්මකාය හෙවත් ප්‍රඥාකාය වැඩිය යුතු බව, එය මුහුකුරා යා යුතු බව අපි දැනගත්තා. ප්‍රඥාකාය වැඩීම සඳහා අවශ්‍ය මූලිකම සත්‍යතාවයයි, අපි ඉහත පරිච්ඡේදයේදී සලකා බැලුවෙ. බොහෝ ආගම්වල මේ සම්‍යක්දෘෂ්ටික ලක්ෂණය (නිවැරදි දැක්ම) යම් තරමකින් හෝ දැකගන්නට ලැබෙන බව දැන් ඔබට පැහැදිලි ඇති. එහෙත් මේ සම්‍යක්දෘෂ්ටික ලක්ෂණය සෑම ආගමක් තුළම වාගේ මේ යුගයේ යටපත් වී තිබීමත් එතරම් වැදගත් නොවන දේ මුල් තැන ගෙන තිබීමත් කණගාටුවට කරුණක්. සෑම ආගමකම පිරිහීම සඳහා ඒ තත්ත්වය හේතුවී තිබෙනවා.

ඉහත පරිච්ඡේදයේ විස්තර කළ කරුණු සියල්ල සාරාංශ කරල නැවත කියනව නම් මෙහෙම කියන්න පුළුවන්. විශ්ව ශක්තිය විශ්ව සත්‍යය, ධර්මකාය හෙවත් මැවුම්කරුවාණන් වහන්සේ ඔබ හා අති සමීප බව අමතක නොකරන්න. එය (එතුමන්) ඔබට මග පෙන්වමින් සිටිනවා, නිවැරදි අරමුණ කරා ඔබ මෙහෙයවමින් සිටිනවා. ඒ මග පෙන්වීමට ඒ මෙහෙයවීමට ඔබ පියවරෙන් පියවර නිසි පිළිතුරු දෙනව නම් එය (එතුමන්) ඔබ ගෙන යනවා ප්‍රඥාව වෙතට, අධ්‍යාත්මිකත්වය වෙතට. එවිට ඔබ මිනිස් පවුල කෙරෙහි බලපාන ජීවිතයක් වෙනවා නිසැකයි. එහෙත් එය විසින් (එතුමන් විසින්) කරන මෙහෙය වීම අවබෝධ වන්නේ, එයට පිළිතුරු දීම පහසු වන්නේ එය විසින් (එතුමන් විසින්) කරන බලගතු ආලේපයක් (ශුද්ධාත්මයාණන් තුළ මුද්‍රා කරනු ලැබීමක්, ජීව පද්මය විකසිත වීමක්, බුද්ධතාවය පිබිදීමක්) තුළින් පමණයි. පසුගිය පරිච්ඡේදයෙන් මා ඔබට තේරුම් කර දෙන්නට උත්සාහ කළේ එවැන්නක්. එවැනි අත්දැකීමක් හා එම අත්දැකීම ඔස්සේ පෙරටම ගලා ගිය ශ්‍රේෂ්ඨ ජීවිතයක් පිළිබඳ උදාහරණයක් මා ඔබ ඉදිරියේ තබන්න කැමතියි.

"1882 රවින්ද්‍රනාත් කල්කටාවේ ජොරසාන්කෝ මන්දිරයේ නො ව සඩර් වීදියේ කෞතුකාගාරය සමීපයේ වු අනෙක් මැඳුරක වාසය කළේය. මේ මාවත නැගෙනහිර දෙසට වැටී ඇත. එහි දෙ පස මහ ගසින් ගැවසි ගෙවතු විය. එක් උදෑසනක ඔහු තම ගෙපිලේ සිටගෙන මේ ගස් පිටුපසින් කෙමෙන් නැඟී එන ළහිරු මඬල දෙස බලා සිටියේය. එදා එසේ සිටිනා විට සිදු වූ අරුම පුදුම පෙරළියක් පිළිබඳව ඔහු මෙසේ ලියන්නේය. මා අවදියෙන් යුතු ව බලා සිටින විට හදිසියෙන් ම මා ඉදිරියේ එතෙක් වූ පැරණි මිහිදුම් පටලයක් ඉවත් ව, ලොව එළිය කරමින් තිබුණු අරුණාලෝකය මගේ අභ්‍යාන්තරයෙහි යම් කිසි ප්‍රීති කාන්තියක් දල්වන ලද බව මට හැඟී ගියේය. සෞන්දර්යයේ හා ප්‍රීතියේ තරංග මාලාවෝ සැම'තින්ම නැඟී ආවෝය. ඔහුට වැටහුනේ එදා ඒ මොහොත වන තෙක් තමා ලෝකය දෙස බැලුවේ තමාගේ කායික නේත්‍රයෙන් පමණක් බවත් දැන් තමාගේ මුළු සිතින් හා ආත්ම භාවයෙන් ද සියල්ල පිළිබඳ නියම සත්‍යය පෙනෙන බවත් ය. අමරණීය ජීවය හා ප්‍රීතියත් සියල්ල අතරේ දිළිසෙන්නට විය. ඒ සමග ම යහළු කොල්ලන් දෙදෙනෙකු අති'නත් වෙළා එක් ව එකට හිනැහෙමින් වීදියේ ඇත යනු ඔහු දුටුවේය. ඒ වනාහී ඔහුට අනන්ත භාවයාගේ ආනන්දය විය. පැටවා සමග සිටින එළදෙන හා ළදරුවා ඇකයෙන් ගෙන යන මවක ද ඔහු දුටුවේය. ඒ වනාහී ඔහුට අනන්ත භාවයාගේ ප්‍රේමයේ කොටසක් විය. විශේෂ නො වන කිසිම දෙයක් ලෝකයේ නො වන බව ඔහුට වැටහුණේය. මේ පෙරළියෙන් මොහොතකට පසු එක්තරා මිනිසෙක් ඔහු හමුවන්නට පැමිණියේය. මෙයට පෙර නම් මේ මිනිසාගේ පැමිණීම ඔහුට කිසිසේත් රිසි වුවක් නො වීය. එහෙත් දැන් මහත් උණුසුමෙන් යුතු ව ඔහු පිළිගත් රවින්ද්‍ර ඒ මිනිසාගේ සමාගමයෙහි ලා අලුත් ම උනන්දුවක් හා

විනෝදයක් දුටුවේය.

මේ පුදුම පෙරළිය සිදු වූ දින ම එතුමා 'උල්පත අවදිවීම' නම් පද්‍ය පංතිය නිර්මාණය කළේය. හිම මිදුණු හිමාලය ලෙනෙහි බැඳී නිහඬ ව නිසල ව සිරගත ව ඇති භාවි ගංගාව-හිරු එළියෙහි උණුසුම ඒ නිදහස් කිරීම-ඉක්බිතිව රිදී රිවි රැස් දහරේ නැහැවී නැහැවී ගලා හැලෙන වතුරේ ප්‍රීතිය-නිදහස් සුවයේ ප්‍රීතිය-කෙළවර සාගර තුරුලට වැදී ඒ හා එක් ව එකට නැති වී යාමේ දී ජනිත වන පරිත්‍යාගයේ හෙවත් යාගික ප්‍රීතිය රවින්ද්‍ර ඒ පද්‍ය පංතියෙන් විස්තර කරන්නේය. මේ කියවෙන ගංගාව නම්, එදා සඩර් වීදියට ඉර පායා එද්දී දුටු දර්ශනයෙන් අමුතු ම නිදහස් ලොවකට පිවිසි රවින්ද්‍රනාත්ගේ ආත්ම භාවයේ ම සංකේතයකි. ඉන්පසු ඔහුගේ මුළු ජීවිත කාලය තුළ දී ම ඔහුගේ නිර්මාණයන් යොමු වූයේ ලෝකයේ සාමාන්‍ය දෙයෙහි ගැබ් වී ඇති ආශ්චර්යයටත් සෞන්දර්යයටත් ය. සර්වබලධාරී දෙවියන් වහන්සේ තමන් වහන්සේ අපගේ දර්ශන පථයට ලක් වනුයේ සාමාන්‍ය වස්තූන් හා සාමාන්‍ය මනුෂ්‍යයා ද තුළින් බවත් උන් වහන්සේගේ මැවීම ගැරහීමෙන් හෝ එයට පිටුපෑමෙන් හෝ අපට කවදාවත් උන් වහන්සේ දර්ශනය කළ නොහැකි බවත් ඒ කළ හැක්කේ එයට ප්‍රේම කිරීමෙන් හා ගෞරව කිරීමෙන් ද බවත් රවින්ද්‍රනාත් තාගෝර් අපට ප්‍රකාශ කරන්නේය.

දෙවි මහෝත්තමයාණන්ගේ අභිමුඛයෙහි හා උන් වහන්සේගේ සමාගමයෙහි ද ඇත්තා වූ අසහාය සාමයත් ප්‍රීතියත් පිළිබිඹු කරමින් එතුමා ආගමික ගීත රැසක් නිර්මාණය කළේය. එක් ගීයක මේ අර්ථය සඳහන් වේ, 'මට ළං ව සිටින්නෝ ඔවුන් මට ළං ව සිටිනවාට වඩා ඔබ වහන්සේ මට ළං ව සිටින බව නො දන්නෝය. මට කතා කරන්නෝ ඔබ වහන්සේගේ ගොළු වූ බසින් මගේ හදවත පිරී ඇති බව නො දන්නෝය. මා යන මාර්ගයේ රොක් වී ගන්නෝ මා ඔබ වහන්සේ සමග එක් ව එක් ව පා නගන බව නොදන්නෝය. මට ප්‍රේම කරන්නෝ ඔවුන්ගේ ඒ ප්‍රේමය මාගේ හදවතට ඔබ වහන්සේ ඇතුළු කරන බව නො දන්නෝය.'

එතුමා ශාන්ති නිකේතනයේ විශ්ව භාරති විශ්වවිද්‍යාලය ආරම්භ කළේය. එය ගොඩනැගිලි රැසකින් ම නොව සොබා දහමේ සෞන්දර්යය තුළ ඉදි වුණු වන පාසලක් විය, එහි ඉගෙන ගන්නා සිසුහු සොබා දහම හා එක්ව එකට ජීවත් වෙමින් සොබා දහම හා එක් ව එකට වැඩ කළහ. සොබා දහම මිතුරකු විනා සතුරකු නො වන බව ඔවුහු තේරුම් ගත්හ. තුරු ලිය හා මිනිසාත් අතර ඇති සොයුරු සබැඳියාව ඔවුහු අත්දැකීමෙන් ඉගෙන ගත්හ. අනෙක් හැම ලෞකික වස්තුවකට ම වඩා උතුම් වූ සත්‍යය ම කොතෙකුත් සිතන්නටත්, සොයන්නටත්, සොබා දහමට ප්‍රේම කරන්නටත්, සැම ජීවිතයකට

ම ගෞරව කරන්නටත් ඔවුහු ඉගෙන ගත්හ. ශාන්ති නිකේතන විද්‍යායතනයේ දවස සංගීතයෙන් ඇරඹිණි: සංගීතයෙන් කෙළවර විණි. රවින්ද්‍ර තමා විසින් ලියන ලද බැති ගී ගයන්නට සිසු කැළ පුහුණු කළේය. සැම දින අලුයම එක් ළමා ගායක කණ්ඩායමක් බැති ගීයක් ගයමින් නිදන සිසුන් අවදි කිරීම සිරිත විය. මේ ගීත දෙවි මහෝත්තමයාණන් වෙත උදේ සවස ප්‍රීතිය හා ප්‍රශංසාව ප්‍රකාශ කරන පිණිස ලියවුණු ගීත විය. දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නා වූ ද උන් වහන්සේ හට වන්දනා කරන්නා වූ ද මිනිසුන් සමග ද, ජගත් කවියා වන උන් වහන්සේ ලොව පුරා විසුරු වන සෞන්දර්යය සමග ද ජීවත් වෙනවා නම් දරුවන් දෙවිඳුන් හට ස්වභාවයෙන් ම පෙම් කරන්නට උගන්නා බව එතුමා විශ්වාස කළේය. සැම දා ඉර පායා එන විට ද ඉර බැස යන විට ද පැය කාල බැගින් නිහඬ ව නිසල ව සොබා දහමේ සෞන්දර්යය තුළ වාඩි වී සිටින්නට එතුමා දරුවන්ට ඉගැන්වුයේය. මේ භාවනාව තුළ ඔවුන් විසින් කුමක් සිතිය යුතු දැ යි එතුමා ඔවුන්ට උපදෙස් නුදුන්නේය. එමෙන් ම ඒ කාලය ඔවුන් කෙසේ ගත කළා ද කියා එතුමා නො විමසීය. එබඳු නිහඬ නිසල මොහොතකින් ඔවුන්ගේ සිරුරටත් මනසටත් ආත්මයටත් යහපතක් සිදු වන බව එතුමා දැන සිටියේ ය. මේ නිහඬ කාලයෙන් පසු සැම ආගමකට ම අයිති සියල්ලෝ එකට එක් ව පොදුවේ මෙවැනි යාච්ඤාවක් උච්චාරණය කළහ.

'ඔබ වහන්සේ අපගේ පියාණෝ ය. ඔබ වහන්සේ අපගේ පියාණන් බව හඳුනා ගන්නට අපට සහාය වුව මැනව. අහෝ! ආලෝකය වූ දෙවි මහෝත්තමයාණෙනි, අප තුළ ඇත්තා වූ දුගුණ සියල්ලක් ම දුරු කළ මැනව. සැම සුගුණයක් ම අප තුළ වගා කළ මැනව. අපගේ ප්‍රීතිය හා සත්‍යය ද වන්නා වූ, ඔබ වහන්සේට අපි වන්දනා කරමු. ප්‍රීතියත් සැම සියලු යහපතත් දානය කරනු ලැබ අපි ඔබ වන්දනා කරමු.'

අසූ වන වියට පත් ව සිටි රවින්ද්‍රනාත් 'තැපැල් පොළ' නම් නාට්‍යය තම සිසු පිරිසකට පුහුණු කරමින් සිටියේය. එහෙත් එය හමාර කරන්නට ඔහුට ඉඩ නො ලැබිණි. තම මරණ මොහොත සමීප බව දුටු එතුමා ඒ නාට්‍යයේ ගීතයක් තම අවමංගල්‍ය සිදු කෙරෙන අවස්ථාවේ ගායනා කරන ලෙස ඉල්ලා සිටියේය. ඒ ගීයේ සරල අදහස මෙය යි, 'ඉදිරියේ ඇත්තේ ශාන්තියේ මහා සාගරය යි. හබල් දරුවෙනි, යාත්‍රාව දියත් කළ මැනවි, ලෞකික වූ බැඳුම් බිඳී යේවා! මහා විශ්වය ඔහු තුරුලු කර ගනීවා! ඔහුගේ නොබිය වූ හදවතින් මහා නාඳුනන්නාණන් හඳුනා ගනීවා!" ('රවින්ද්‍රනාත් තාගෝර්' - හියුබත් දිසානායක)

මහෝත්තමයාණන් හා එක්ව එක්ව පියමං කළ ශ්‍රේෂ්ඨ ජීවිතයක් ගැනයි, මා ඔබගේ අවධානය යොමු කළේ. සැබවින්ම එක පියවරක් පමණයි, එය විසින් (එතුමාණන් විසින්) ඔබට පෙන්වා දෙන්නෙ. එයට ඔබගෙන් නිසි

ප්‍රතිචාරයක් ලැබුනොත් පමණයි, ඊළඟ පියවර පෙන්වා දෙන්නෙ. එනිසාම එය මනුෂ්‍ය ස්වභාවයට අභියෝගයක් වන ගමනක්, සැබවින්ම එය පටු පාරට ඇතුළු වීමක්. මෙවැනි ගමනකට පිවිස එහි කෙළවර දක්වා යාම සැබවින්ම වීර චාරිකාවක් ලෙස හඳුන්වන්න පුළුවන්. ප්‍රඥාකාය වැඩීම එය මුහුකුරා යාම එහි ප්‍රතිඵලයයි. ප්‍රඥාකාය වැඩෙන තරමටයි, අප තුළ සදාතන යෞවනත්වය ඇතිවන්නේ.

සමිඳුන් ගෙනයන අධ්‍යාත්මික ගමන කෙළවර දක්වාම ඉඩදුන් එමගින් යෝධ අධ්‍යාත්ම කායක් බවට පත් වූ ශු. බයිබලයේ නව ගිවිසුමේ සඳහන් ප්‍රබල චරිතයක් ගැන අපි දැන් කරුණු ටිකක් සොයා බලන්නටයි, උත්සාහ කරන්නේ. උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ හමුවීමත් සමග එතුමාණන්ගේ ආත්මයාණන් වහන්සේගේ මෙහෙයවීම හැඳින ගනිමින් ඒ මෙහෙයවීමට මුළුමනින් අවනත වීමයි එතුමාගේ ජීවිතය වූයේ. ඒ ගමන් මග කොතෙක් කටුක වුව ද, මනුෂ්‍ය ස්වභාවයට එය කොතෙක් බිහිසුණු වුව ද එතුමා සමිඳුන් පෙන්වන මග ඔස්සේ පෙරටම පියමං කළා. ශුභාරංචිය ලොවට ගෙන යන්නට සමිඳුන් සුරතේ එතුමා ප්‍රබල අවියක් වූයේ ඒ නිසයි. එදා රෝමවරුන්ගේ සභාවේ අයවලුන් දැකගන්නට එතුමා ආශාවෙන් සිටියත් ශුද්ධාත්මයාණන් ඒ සඳහා තමා මෙහෙයවනවා නම් පමණක් ඔවුන් දැක ගන්නට එන බවයි එතුමා ඔවුන්ට ලියා යැව්වේ. තම ආශාවන් ඉටුකර ගන්නට නොවෙයි, ශුද්ධාත්මයාණන් විසින් පෙන්වා දෙන මග යන්නටයි, එතුමාට අවැසි වූයේ.

සුබ අස්න වෙනුවෙන් තම දිවි පිදීම ළංව ඇතැයි එතුමාට හැඟුණ මොහොතේ එතුමා එපිසිවරුන් අතරට ගොස් ඔවුන්ට මෙලෙස පැවසුවා. “දේව රාජ්‍යය ගැන දේශනා කරමින් නුඹලා අතරෙහි ඇවිද්දා වූ මගේ මුහුණ නුඹලා සියල්ලන් තවත් නොදකින බව මම දනිමි.” එතුමා ඔවුන්ට මෙලෙස ද පැවසුවා. “ආත්මයාණන් විසින් බඳිනු ලැබ මම ජෙරුසලමට යමි. එහිදී මට කුමක් වේ ද කියා මම නොදනිමි. එහෙත් සිරගත වීම් හා පීඩා ද පැමිණෙනු ඇතැයි ශුද්ධාත්මයාණන් වහන්සේ සාක්ෂි දෙන සේක.” (ක්‍රියා 20:22,23) “ශුද්ධාත්මයාණන් විසින් බඳිනු ලැබ” යන යෙදුම ශු. පාවුලු තුමාගේ ජීවිත අත්දැකීම පිළිබඳ කදිම ප්‍රකාශනයක්. දේව ආත්මයාණන් විසින් තමා මෙහෙයවනු ලැබීම පිළිබඳ සත්‍යයේ එතුමා හිරකාරයෙක් වුණා. ඒ සත්‍යයේ අගය, එය මිනිස් පවුලේ විමුක්තිය කෙරෙහි ඉටුකරන බලපෑම අවබෝධ කරගත් නිසා ඒ සත්‍යයේ හිරකරුවෙක් වීම එතුමා කැමැත්තෙන් වැළඳ ගත් ජීවිත තත්ත්වයක්. එය වටහා ගන්නට ශු. බයිබලයේ උපදේශකයා පොතේ 6:23-31 වැකි ඔබට ද උපකාරී වන නිසැකයි. ප්‍රඥාව ලබා ගැනීම, ප්‍රඥාව විසින් හික්මවනු ලැබීම, ප්‍රඥාව විසින් ජීවිතය පලබර කරනු ලැබීම ගැනයි.

එහි විස්තර වන්නේ. ප්‍රඥාව ඇය වශයෙන් එහි සඳහන් වී තිබෙනවා.

"මාගේ පුත්‍රය සවන් දෙන්න, මගේ අවවාදය පිළිගන්න.
ඔබේ පාද ඇගේ විලංගු තුළට දමන්න.
ඔබේ බෙල්ලට ඇගේ කරපටිය දමා ගන්න.
ඔබේ උරහිස ඇගේ වියගහට පාන්න.
ඇගේ තෝන්ලණු නිසා දඟකාර නොවන්න.
ඔබේ මුළු සිතින් ඈට ප්‍රේම කරන්න.
ඔබේ මුළු ශක්තියෙන් ඇගේ මාවත අනුව යන්න.
ඈ පසුපස ගොස් ඈ සොයන්න.
ඈ ඔබට තමා එළිදරව් කරනු ඇත.
ඈ අල්ලාගත් කල යන්ට නොහරින්න.
අන්තිමේදී ඇය තුළ ඔබට ශක්තිය සම්බ වන්නේය.
ඔබ උදෙසා ඇය ප්‍රීතියට හැරෙන්නීය.
ඇගේ විලංගු ඔබට ශක්තිමත් ආරක්ෂාවක් වන්නේය.
ඇගේ වියගහ රන්මුවා අබරණක් වන්නේය.
ඇගේ තෝන්ලණු රන්නිල් පීත්ත පටි වන්නේය.
අලංකාර වස්ත්‍රයක් මෙන් ඔබ ඈ ඇඳගන්නෙහිය.
මහිමයේ කිරීටයක් මෙන් ඔබ ඈ පැළඳ ගන්නෙහිය."

## 04

අධ්‍යාත්මකාය හෙවත් ප්‍රඥාකාය වැඩෙන්නෙ ආගම් පිළිබඳ පසුබිම් දැනීමෙන් හිස පුරවා ගැනීමෙන්ම නොවෙයි, විශ්ව ශක්තිය විසින්, විශ්ව සත්‍යය විසින්, ධර්මකාය විසින්, ධර්මයාණන් විසින්, විශ්ව මැවුම්කරුවාණන් විසින් උගන්වනු ලැබීමෙන්, මෙහෙය වනු ලැබීමෙන් ඒ මෙහෙයවීමට අවනත වීමෙන් බව අපි පසුගිය පරිච්ඡේදයෙන් වටහා ගන්නට උත්සාහ කළා. ප්‍රඥාකාය වැඩෙනු සඳහා අපට යන්නට සිදුවන ඒ මඟ පිළිබඳ තවත් කරුණු ටිකක් සොයා බලන්නටයි, අප මෙහි දී උත්සාහ කරන්නේ.

බොහෝ දෙනා හිතන්නෙ අපට තෝරා ගන්න මාර්ග දෙකක් පමණක් ඇති බවයි. එය හරි මඟ හා වැරදි මඟ වශයෙන් හඳුන්වා දෙන්න පුළුවන්. ආගමක් නොඅදහන අය වුණත් මේ මාර්ග දෙක දකිනවා. ආගම් අදහන අය අතරින් වැඩි දෙනෙක් ද මේ මාර්ග දෙක පමණයි, දකින්නේ. හරි මඟ යන්නට වැරදි මඟෙන් ඉවත් වන්නට බොහෝ දෙනා අවංකව උත්සාහ කරනවා. එය අගය කළ යුතු දෙයක්. එහෙත් බොහෝ දෙනෙක් දන්නෙ නැහැ හරි මඟට

වඩා අතිශයින් උත්තරීතර මාර්ගයක් ඇති බව. ශු. බයිබලය තුළ විශේෂයෙන් එහි සුවිශේෂ පොත් තුළ ඒ මඟ දැකගන්න හැකි නිසා එය සුවිශේෂ මාර්ගය (Gospel Way) ලෙස හඳුන්වා දෙන්න පුළුවන්. කවුරුන් හෝ ඒ මග ගමන් කළොත් එය මුළු මිනිස් වර්ගයාට සුවිශේෂී අත්දැකීමක් වනු නිසැකයි. ධර්මකාය විසින් මැවුම්කරුවාණන් විසින් අප මෙහෙයවනු ලබන්නේ සුවිශේෂ මාර්ගයේ ගමන් කරනු සඳහායි. පසුගිය පරිච්ඡේද ඇසුරෙන් මා ඔබට වටහා දෙන්නට උත්සාහ කළේ සුවිශේෂ මාර්ගයට පිවිසීමේ අවශ්‍යතාවය පිළිබඳවයි.

සුවිශේෂ මාර්ගය පිළිබඳ ලොකු විග්‍රහයක් නොවෙයි, ඒ ගමන් මඟ පිළිබඳ පුංචි ඉඟි ටිකක් පමණක් ඔබ ඉදිරියේ තබන්නට මා අදහස් කරනවා. “මිනිසාට කළ හැකි හා කළ යුතු දේ මත යැපෙන තත්ත්වය හරි මඟ හා වැරදි මඟ දෙකටම පොදු ලක්ෂණයක් ලෙස සඳහන් කරන්න පුළුවන්. සුවිශේෂ මාර්ගයට අනුව සිදුවූ ක්‍රියාවක් නම් එය දෙවිඳුන් විසින්ම මුල පුරන ලද්දකි, බලවත් කරන ලද්දකි, පූර්ණ කරන ලද්දකි. සුවිශේෂ මඟ යන්නට නම් සැමට පළමු දෙවිඳුන් අප ඉදිරියේ තබන එතුමන්ගේ ක්‍රියා හඳුනාගත යුතු වෙනවා. හරි මඟ අනුව කළ යුතුව ඇත්තේ මා විසින් තීරණය කරන දේ. සුවිශේෂ මාර්ගය අනුව කළ යුතුව ඇත්තේ දෙවිඳුන් විසින් මුල පුරන දේ. සුවිශේෂ මාර්ගයේ ගමන් කිරීම සඳහා සමිඳුන්ගේ මුල පිරීමට අප සියුම් අයුරින් විවෘත වන්න ඕනැ. දෙවිඳුන් අප ඉදිරියේ යම් වැඩක් තබා එය තුළ ගමන් කරන්නට අණ කළ විට අප තුළ හා අප තුළින් කළ නොහැක්ක කිරීමට එතුමා සූදානම්.” (ලෙරී ක්‍රිස්ටෙන්සන් දේව ගැති තුමා, New Covenant - 1981 ජනවාරි)

සුවිශේෂ මාර්ගයේ කෙළවර දක්වා ගමන් කිරීම පිළිබඳ පරමාදර්ශය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ බව අපට නිසැකවම කියන්න පුළුවන්. තමාගේ කැමැත්ත ඉටුකර ගැනීම නොවෙයි, තමන් මෙලොවට එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමයි, එතුමාගේ ජීවිත පරමාර්ථය වූයේ. තමන් මෙලොවට එවූ තැනැන්වහන්සේට තම ආදරවන්ත තාත්තා හැටියට (එතුමා කතා කළ ඇරමයික් බසින් අබ්බා හැටියට) එතුමා ඇමතුවා. ප්‍රේමවන්ත පියා හා ප්‍රේමවන්ත පුත්‍රයා හැටියට සමීප සබැඳියාවක් එතුමා ගොඩනගා ගත්තා. පියාට නිරන්තරව සංවේදිව සිටිමින් යාච්ඤා ජීවිතයක් තුළ පියාගේ කැමැත්ත හැඳින ගන්නටත්, එයින් පෙන්වන ගමන් මඟ කොතෙක් කටුක වුව ද දිවි පරදුවට තබා හෝ එයට කීකරු වන්නටත් එතුමා ක්‍රියා කළා. තිස් තුන් අවුරුදු ජීවිතයක් තුළ එතුමා කළ මූලිකම දෙය එපමණයි. එහෙත් එමගින් පියාණන් වහන්සේ තම පුතණුවන් මගින් බොහෝ දේ ඉටුකර ගත්තා. අන්ධකාරයේ බලය පරාජයට පත්කරමින් මානව විමුක්තිය හා මානව විජයග්‍රහණය එමගින්

සම්පාදනය කර ගත්තා. තම ජීවිතය තුළින් තම ස්වර්ගීය පියා (අබ්බා) මහිමයට පත්කරන්න ඇති ජ්වලිතය තුළින් දැල්වුන පරමාදර්ශී ජීවිතයක් එය. “පියාණනි, මම ඔබගේ කැමැත්ත කරන්නට පැමිණ සිටිමි” යන්න ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ තේමා ගීතය වුණා.

යමෙක් මේ සත්‍යය වෙනුවෙන්ම කැපවී ඒ කැපවීම තුළ අහිතව දිවි හිම්යෙන් පෙරටම ගමන් කළොත් ඔහු අසම්මතයෙක් ලෙස පිටස්තරයෙක් ලෙස හැඟෙන එක වලක්වන්න පුළුවන් දෙයක් නොවෙයි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ එදා සමාජයට පමණක් නොව සැම යුගයක් තුළ අසම්මතයෙක් ලෙස කැපී පෙනෙනවා. (අසම්මතයා යන වචනය මෙහි යෙදුවේ කොලින් විල්සන්ගේ 'The Outsider' පොත අනුවයි.) ඊට හේතුව පරම යථාර්ථය විසින් කෙනෙක් මෙහෙයවනු ලබන්නේ මනුෂ්‍ය සාරධර්ම, මනුෂ්‍යය වටිනාකම් ඉක්මවා දේව සාරධර්ම දේව වටිනාකම් වෙතට වන නිසයි. එවැන්නකු කරන කියන දේ තුළ බැලූ-බැල්මට පරස්පරයක් දකින්නට ලැබෙනවා. ක්‍රිස්තු ජීවිතය තුළ ඒ පරස්පරය ප්‍රබලව කැපී පෙනෙනවා. එයට හේතුව පරම සත්‍යය තුළම බැලූ-බැල්මට පෙනෙන පරස්පරයක් පැවතිමයි. එහෙත් ඒ පරස්පරයම එක හා සමාන සත්‍යයක්. ක්‍රිස්තු ජීවිතය තුළින් එක උදාහරණයක් අරගෙන එය වටහා ගන්නට අපි උත්සාහ කරමු. කෙනෙකුට ජඩයා කියල නොකියන ලෙසත් එසේ කීම වරදක් බවත් ක්‍රිස්තුස් වහන්සේ කන්ද උඩ දේශනාවේ දී සඳහන් කරනවා. (මතෙව් 5: 22) තවත් අවස්ථාවක එහි රැස්ව සිටි සෙනග ක්‍රිස්තුස් වහන්සේට දන්වනවා හෙරෝද් රජ එතුමන් සොයමින් සිටින බව. ලූක් සුවිශේෂය 13: 31, 32 පද එය සටහන් කර ඇත්තේ මෙලෙසයි. “පරිසිවරුන්ගෙන් සමහරෙක් පැමිණ මෙතැනින් අහක්ව ගිය මැනව. මන්ද, හෙරෝද් ඔබ මරනු රිසියෙන් සිටින්නේය”යි කීහ. උන්වහන්සේ ඔවුන්ට කතා කොට මෙසේ වදාළ සේක. “ඔබ ගොස් ඒ හිවලාට මෙසේ කියන්න. ---” මෙය පරස්පරයක් කියල ඔබට හැඟෙන්න පුළුවන්. එහෙත් මේ මතුපිටින් පෙනෙන පරස්පරයම එක හා සමාන සත්‍යයක් බව මා මීට ඉහත ද සඳහන් කළා. කෙනෙකුට ජඩයා කීවොත් පාපයක් සිදුවන්නේ කොයි මොහොතේ ද, කෙනෙකුට හිවලා නොකීවොත් පාපයක් සිදුවන්නෙ කොයි මොහොතෙ ද කියන එක දේව ආත්මයාණන් විසින් ඒ ඒ මොහොතෙ පෙන්වා දිය යුතු දෙයක්.

බැලූ-බැල්මට පෙනෙන පරම සත්‍යයේ පරස්පරය යමෙක් තුළ ඒකත්වයට පැමිණෙන්නේ දේව ආත්මයාණන්ගේ සියුම් මඟ පෙන්වීම ලැබෙනවා නම් පමණයි. ක්‍රිස්තු ජීවිතය තුළ පමණක් නොව ශු. බයිබලය තුළ සඳහන් අධ්‍යාත්මකාය වැඩුණු සියල්ලන් තුළ යම් තරමකට හෝ මේ බැලූ-බැල්මට පෙනෙන පරස්පරය දකින්න පුළුවන්. එපමණක් නොව අභ්‍යාන්තර සියුම් හඬ විසින් කරන මඟ පෙන්වීමේ සේවකයෙක් වූ මහත්මා ගාන්ධි තුමා

තුළ ද මේ පරස්පරය දක්නට ලැබෙනවා. එතුමාගේ ප්‍රධාන ශිෂ්‍යයෙක් වූ ආචාර්ය ශ්‍රී විනෝබා භාවේ තුමා මෙසේ පවසනවා. “මා කාසි නගරයෙහි සිටිද්දී මගේ ප්‍රධාන අරමුණ වූයේ හිමාලය පෙදෙසට යෑමයි. එමෙන්ම බෙංගාලය දැකීමේ ආශාවක් ද මා තුළ පැවතිණි. එහෙත් මේ සිහින දෙකම සාර්ථක කරගත නොහැකි විය. දෙවියන් වහන්සේ මා ගාන්ධිජී වෙතට ගෙනා සේක. හිමාලයේ සාමය මෙන්ම බෙංගාලයේ විප්ලව උණුසුම ද ගාන්ධි තුමා තුළ තිබෙන බව මට අවබෝධ විය. මා තුළ පැවති බලවත් ආශා දෙකම සම්පූර්ණ වුණා යැයි මම මටම කියා ගතිමි.” ('සර්වෝදයේ මාර්ගෝපදේශකයා' ඇසුරෙනි.)

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කළ ප්‍රකාශයක් ජුවාම් 5:19 මෙලෙස සටහන් කර තිබෙනවා. “ඉදුරා ම මම ඔබට කියමි. පුත්‍රයාණන්ට කිසිවක් තනි බලයෙන් කළ නොහැකිය. ඔහුට කළ හැක්කේ පියාණන් වහන්සේ කරන බව තමන්ට පෙනෙන දෙය පමණකි.” පියා තමාට පෙරටුව තබන දේ හා එහි මඟ සලකුණු හඳුනාගෙන ඒ ඔස්සේ යාම පමණයි, පුත්‍රයාට කළ හැක්කේ. ඒ අත්දැකීමයි, ලෝකය උසස් කරන්නේ. එම මඟ එන ලෙස එතුමන් අපට ඇරැයුම් කරනවා. ලූක් 9: 59, 60 මෙලෙස සඳහන් කරනවා. “ජේසුස් වහන්සේ තව කෙනෙකුට මා අනුව එන්නැ”යි වදාළ සේක. ඔහු “ස්වාමිනි, පළමුකොට මගේ පියා භූමදාන කරන පිණිස යන්ට මට අවසර දුන මැනව”යි කීය. උන්වහන්සේ උත්තර දෙමින් මළවුන්ගේ භූමදානය මළවුන්ම කළාවේ. ඔබ ගොස් දෙවියන් වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශ කරන්නැ යි ඔහුට වදාළ සේක.” ජේසු සමිඳුන් අමතා ඔහු කළ ඉල්ලීම හරි මඟට එකඟ බව අප කාටත් පැහැදිලියි. එසේ නම් ක්‍රිස්තුස් වහන්සේ මේ තුළින් අපට කියන්නේ කුමක්ද කියල අප සිතා බැලිය යුතුයි. (යමක් වැරදි නිසාම නොවෙයි ඔබ එය නොකළ යුත්තේ. යමක් හරි නිසාම නොවෙයි, ඔබ එය කළ යුත්තේ. මා ඔබට කියන දෙයයි ඔබ කළ යුත්තේ.) මෙවැනි අදහසක් එහි ගැබ්ව තිබෙනවා. මිනිස් බව ගත් මැවුම්කරුවාණන්මයි, මාංශගත වූ විශ්ව සත්‍යමයි, මාංශගත වූ ධර්මකායමයි, මෙලෙස පැවසුවෙ.

(ආර්. ඇම්. ලාලාගේ 'Search of Leadership' - 'උදාර නායකත්වය' - ටී. ඇම්. කරුණාතිලක) මෙසේ සඳහන් වෙනවා. 'ගාන්ධි විප්ලවයක් පිළිබඳ අධ්‍යයනයක්' යන කෘතිය සම්පාදනය කළ ජියොෆ්‍රි ඈෂ්, ගාන්ධිගේ වශීකරන ශක්තියේ රහස කුමක්ද? යන ප්‍රශ්නය නගයි. එම ප්‍රශ්නයට ඈෂ්ම මෙසේ පිළිතුරු දෙයි. “මහත්මාගේ චිත්තාභ්‍යන්තරයේ රහස වූ කලි උද්‍යෝගයම නොවේ. එය දෙවිඳුන්ගේ මෙහෙයවීම් සහිත උද්‍යෝගයකි. විධායකයකුගේ උද්‍යෝගය ඔහුගේ සංවිධානය ගැනයි. ගාන්ධිගේ උද්‍යෝගය දේව සත්‍යය නැතහොත් අන් කවර වචනයකින් හෝ හැඳින්වෙන පරම තත්ත්වයක් කෙරෙහි

විය. ඔහු තමා ඇදහූ දෙය එදිනෙදා කටයුතුවලට මුසු කළේය. ගාන්ධිගේ අනුග්‍රහය ලැබූ ව්‍යාපාර බොහෝ විය. නූල් කැටීම, ග්‍රාමීය කර්මාන්ත, හරිජනයන් දියුණු කිරීම, ජාතික සමගිය ඒවා අතර විය. --- මතුපිටින් පෙනෙන අයුරු මේ හැම ව්‍යාපාරයකටම ගාන්ධි කැපවී සිටියේය. එහෙත් දෙවියන් පිළිබඳ දෘෂ්ටියක් ඇති කෙනෙක් කිසියම් ව්‍යාපාරයකට හෝ ප්‍රශ්නයකට කැපවූවෙක් නොවේ. ඔහුගේ කැපවීම දෙවියන් උදෙසාය."

මහත්මා ගාන්ධි තුමා මෙලෙස කියා ඇත. "දෙවියන් වහන්සේ වනාහී මට සජීව අභිමුඛයකි. ඔබත් මාත් මේ කාමරයේ සිටිනවා යන්නට වඩා නිසැක අවබෝධයක් දෙවියන් වහන්සේගේ වැඩසිටීම පිළිබඳව මා තුළ ඇත්තේය. වාතය හෝ ජලය නොමැතිව මට යම් කිසි කාලසීමාවක් ජීවත් විය හැකිය. එහෙත් උන්වහන්සේ නොමැතිව මට මොහොතක්වත් ජීවත් විය නොහැකිය. ඔබ මගේ දෑස උගුලා දැමුවත් එයින් මගේ මරණය සිදුනොවේ. එහෙත් දෙවියන් වහන්සේ පිළිබඳ මගේ විශ්වාසය වනසන්න. එවිට මම මිය යමි." (හරිජාන් 1938.5.14) "මගේ ජීවිතයේ දී වැදගත් දෙයක් මා කර ඇත්නම් එය තර්ක බුද්ධියෙන් මා මෙහෙයවනු ලැබ කරන ලද්දක් නොවේ. එය දෙවියන් වහන්සේ විසින්ම මෙහෙය වනු ලැබ කරන ලද්දකි." යනුවෙන් එතුමා සාක්ෂි දරයි. ඔබට ද එම අභ්‍යාන්තර සියුම් හඬ අවබෝධ වේ නම් එය ඔබ මෙහෙයවන දෙසටම යන ලෙසත් ඔබෙන් යමෙකුට ඒ හඬ නොඇසේ නම් වඩා හරිව තිබෙන දේ කරන ලෙසත් එතුමා උපදෙස් දෙයි. එසේම දේව මඟ පෙන්වීම සොයන්නාට තරම් සමහර විට අඳුරේ අතපත ගාන්නට වෙන කිසිවෙකුට සිදුනොවන බව ද එතුමා මතක් කර දෙයි. එම සියුම් මඟ පෙන්වීම ඇතිව නම් එක් කෙනෙකුගෙන් පමණක් යුත් සුළු පක්ෂයකට අයත් වීමට තමාට සිදුවුවත් එවැනි බලාපොරොත්තු රහිත සුළු පක්ෂයකට අයත්ව සිටීමට තරම් ධෛර්යයක් තමා තුළ ඇතැයි එතුමා පවසයි. (ශ්‍රී ක්‍රිෂ්ණ ක්‍රිපලානිගේ 'All Men are Brothers. - 'එක මවකගෙ දරුවෝ' ඇසුරෙනි.)

## 05

මා මෙතෙක් ඔබ හා කතා කරමින් සිටින සත්‍යය ඔස්සේම කිව යුතු තව කරුණු ස්වල්පයක් ඔබ ඉදිරියේ තබන්නට මා කැමතියි. සදාතන යෞවනත්වය රැක ගැනීමේ රහස ප්‍රඥාකාය හෙවත් අධ්‍යාත්මකාය වැඩීමයි. ඒ සඳහා ධර්ම ඥානය හා උත්තම කලාව මගින් සියලු පැවැත්මෙහි උල්පත සමග මහා පැවැත්මයාණන් සමග එහි (එතුමන්ගේ) සියුම් මඟ පෙන්වීම සමග දිවි ගෙවිය යුතු වෙනවා. එලෙසයි, ප්‍රඥා පාරමිතාව අප විසින් පිරිය යුතු වන්නේ.

"ජීවිතය විසඳිය යුතු ගැටළුවක් නොවේ, එය ජීවත් විය යුතු අභිරහසකි." අසිසියේ සාන්ත ප්‍රැන්සිස් මුනිතුමා එලෙස සඳහන් කරනවා. අභිරහසක් යනු තේරුම් ගෙන නිමාවට පත්කරන්න බැරි දෙයක්. එක පියවරක් ගනිද්දියි ඊළඟ පියවර වැටහෙන්නේ. දේව මඟ පෙන්වීම ඔස්සේ එලෙස පියමං කරද්දි ජීවිතය නමැති ශුද්ධවූ අභිරහස පසක් කර ගන්න අපට බොහෝ දුරට හැකිවනු ඇති. දේව ආත්මය අපට කතා කරන්නෙ වචනවලින් පමණක් නොවෙයි, ජීවිත සිද්ධිවලින්. මේ අත්දැකීමට අයිති වූ විට මේ ප්‍රවාහයට හසුවූ විට කිසිවක් අහම්බයක් නොවෙයි, සියල්ල තුළ සැලැස්මක් රටාවක් දැකගන්න පුළුවන්. සෑම ආගමකම, සෑම රටකම, සෑම යුගයකම මෙලෙස උගන්වන අය, හැඩගසන අය, සේවයේ යොදවන අය කලාතුරකින් හෝ දැකගන්න පුළුවන්.

පුංචි ළමයා සියල්ල විමසනවා. මැවුම්කරුවාණන් තරයේ ඇදහීමෙන් එතුමන් කෙරෙහි ගරුබිය දැක්වීමෙන් ළමා වියේ සිට රැකගත් සියල්ල විමසීමේ උතුම් ගුණය නැතිවී බොළඳ වෙනවා කියලා සමහරු හිතන්න පුළුවන්. එහෙත් දෙවිඳුන් තරයේ ඇදහීම අසීමිත ගවේෂණ ක්ෂේත්‍රයට පිවිසීමක්. බාල වියේ සිට ප්‍රගුණ කළ සියල්ල විමසීමේ ගුණය බලගතුව ඉදිරියට ගෙන යාමක්. එමගින් ලෝකය පිළිබඳ ඥානයම නොවෙයි, යුගය ජය ගැනීමට අවැසි සැබෑ ප්‍රඥාව මතු වෙනවා. විශ්ව ශක්තිය විසින් ධර්මකාය විසින් ශුද්ධාත්මයාණන් විසින් ඔබට පෙරටුව කරන මෙහෙය වීම හැඳින ගනිමින් එයට නිසි පිළිතුරු දෙන්නට අපි සූදානම් වෙමු. එයයි, සැබෑ ආගමික ජීවිතය. ධර්ම ඥානය පසක් කර ගන්නට හැකි වන්නේ එමගින් පමණයි. මා කරන දේ නොවෙයි, දෙවිඳුන් මා තුළින් කර ගන්නා දෙයයි, සභාව රට ලොව තුළ සැබෑ වෙනසක් ඇති කරන්නේ. අපි ඒ සත්‍යයේ සාක්ෂිකරුවන් විය යුතු නොවෙමුද? එය යුගයේ ප්‍රබල අවශ්‍යතාවයක්. එනිසා ලෝක ප්‍රවාහය වෙනුවට දේව ප්‍රවාහයට හසුවෙමු. එසේ නොවුණොත් තමාගේ ආශාව කැමැත්ත ඉටුකර ගන්නයි, අප උත්සාහ කරන්නේ. එනිසා මේ මහා ශුද්ධවූ ප්‍රවාහයට හසුවිය යුතුමයි.

පරම සත්‍යයේ, ධර්ම ස්කන්ධයේ, දේව ආත්මයේ සියුම් මඟ පෙන්වීම ඔබ තුළ පවතී නම් එම මඟ පෙන්වීමට ඔබ අවනත වේ නම් ඔබ මොන තරම් පොහොසත්ද? එවිට ඛලිල් ජිබ්රාන් සමග ඔබට මෙලෙස කියන්නට පුළුවන. "මුළු මහත් ජනතාවම සතුව ඇති ධන සම්භාරයන් මට දෙතැයි කීවත් මම මගේ හදවතේ සිනහව ඒ ධනයට මාරු නොකරමි." ('දෙවිදුරු අරටු') දේව ආත්මයේ සියුම් මඟ පෙන්වීම ඔබ තුළ තබා ඇති ගීතයක් වගෙයි. එය නිරන්තර අනාවරණයෙන් පිරි ලෝකයක්. එය ඔබ කනට මුමුනා කියන්නේ ඔබ තනියම නොවන බවයි. සියලු පැවැත්මෙහි ජීව බලය, ඒ මහා පැවැත්මයාණන්

ඔබ තුළ නිවහන් ගත වී ඇති බවයි. එවිට රවීන්ද්‍රනාත් තාගෝර් කිවියාණන් හා එක්ව ඔබට මෙලෙස කියන්නට පුළුවන. "ප්‍රේමයේ සුරතල් දෑත මෙන් මගේ මේ ගීය අවුත් සංගීතයෙන් ඔබ පුරවා ගනියි, මගේ දරුව. මගේ මේ ගීය ආශිර්වාදයේ හාදුවකින් මෙන් ඔබේ නලල්තලය ස්පර්ශ කරයි. ඔබ හුදෙකලාව සිටින විට එය ඔබ ළඟ වාඩි වී ඔබේ කනට කොඳුරනු ඇත. ඔබ පිරිස මැද සිටින විට එය ඔබ ඔවුන්ගෙන් වෙන්කර තබාගනු ඇත. අඳුරු රැය ඔබ යන මඟ වසාගෙන සිටින විට එය ඔබේ හිසට උඩින් ඇති විශ්වාසවත් තරුව මෙන් දිදුලනු ඇත. මගේ මේ ගීය ඔබේ ඇස්වල කළු ඉංගිරියාවේ හිඳ හැම දෙයක හදවතට ඔබේ දර්ශනය ගෙන යනු ඇත." ('අඩ සඳ')

මෙතෙක් මා ඔබ හමුවේ තැබූ කරුණු තුළින් ඔබ විශේෂ රාමුවකට කොටු කරන්නට හෝ ක්‍රම විධි කීපයකට සීමා කරන්නට හෝ අදහස් කරන්නෙ නැහැ. විශ්ව යථාර්ථය අසීමිත ලෙස විශාලයි. එහි ගැඹුර මෙතෙකැයි කියන්න බැහැ, එහි පළල මෙතෙකැයි මනින්න බැහැ, හෙවත් විශ්ව යථාර්ථය අගාධයි, අපාරයි. එනිසා එකිනෙකා තුළ දේව මඟ පෙන්වීමේ විවිධත්වයට අප වඩාත් විවෘතව සිටිය යුතුයි. ඊට ගරු කළ යුතුයි. ශ්‍රේෂ්ඨ චිත්‍ර ශිල්පියකු වන මංජු ශ්‍රී පිළිබඳව සිරිල් බී. පෙරේරා සූරින් 'නව යුගය' පුවත් පතට ලියූ ලිපියක කොටසක් මා ඔබ ඉදිරියේ තබන්නට කැමතියි.

"මං එනකොට දැක්කා ඉර බහිනවා. අද ලස්සනට පේනවා. අපි යමු ද හය වෙන කොට එතැනට? --- එදා ඔහු බැස යන හිරු ගැන කියූ දෙය මා අසා සිටියේ ඉසිවරයෙකු බ්‍රහ්මාත්මය ගැන මෙනෙහි කරන මොහොතක තමා නොදැනුවත්ව ශබ්ද නගා කළ භාවනාව අසා සිටි ශිෂ්‍ය මානවකයකු ලෙස ය. අන්තරීක්ෂය මෙන්න මේ වෙලාවට යි හුඟාක් ම පාන්දරට යි තමා මිනිසුන්ට කතා කරන්නේ. වෙනස් වන හැම වර්ණයකින් ම කතා කරනවා. ඒ වුණාට අපට ඒක තේරුම් ගන්ඩ නම් විශ්ව ආත්මයක් ඇති කර ගන්ඩ ඕනැ. බ්‍රහ්මාත්මය කිසි ම දවසක කිසි ම මොහොතක කිසි ම මිනිහෙකුට එක ම දෙයක් කියන්නෙ නැහැ. අන්න ඒ හින්ද තමයි අපි හැම මිනිහෙක් ම අලුත් දෙයක් අසන අලුත් දෙයක් කියන අලුත් මිනිහෙක් වෙන්නෙ. හරියට ම ඉරෙන් පෝෂණය වන වර්ණය ලබා ගන්නා එක ම මලක්වත් තවත් මලක් වාගෙ නොවන්නා වාගෙ. ඔන්න ඔය පෞද්ගලිකත්වය අප එකිනෙකාට හිමි වෙලා තියෙන පෞද්ගලිකත්වය තේරුම් ගන්ඩ පුළුවන් වුණු දාට තමයි, අපි මේ කරන දේවල තේරුමක් තියෙන්නෙ. මේ දරුවාට (ඔහු ළදරු අත්කරත්තයේ සිටි දරුවා දෙස බැලීය.) ඒක තේරුම් කරලා දෙන්ට ලැබුණොත්. ඒ මොහොතේ මට හැඟුණේ අප හැම දෙනෙකු ම ඔහුගේ දරුවකු ලෙස යි. ඉන්දීය සාගරයේ බොහෝ එහා කොහේ ද කොණකින් හිරු බැස ගියේය. අප එකිනෙකා හඳුනා ගන්නට බැරි තරම් වන අඳුරේ සමු ගත්තෙමු."

මෙතෙක් මා පැවසූ සත්‍යතාවයට සාක්ෂි දරන ශු. බයිබලයේ, ගීතාවලිය 139 ගීතයේ කොටසක් දැන් මා ඔබ හමුවේ තබන්නට කැමතියි. එය දාවිත්ගේ ගීතයක් ලෙසයි සඳහන්ව ඇත්තේ.

"ස්වාමිනී, ඔබවහන්සේ මා විමසා බලා දැනගත් සේක.
ඔබවහන්සේ මගේ හිඳීම ද නැගිටීම ද දන්නා සේක.
දුරදීම මගේ සිතුවිල්ල ඔබට තේරෙයි.
ඔබවහන්සේ මගේ ගමනත් සයනයත් විමසා බලන සේක.
මගේ සියලු මාර්ග දැනගෙන සිටින සේක.
මා මුවට වචනයක් එන්නටත් පෙර ස්වාමිනී, එහි අග මුල ඔබවහන්සේ දන්නා සේක.
ඉදිරියෙන් ද පසුපසින් ද ඔබවහන්සේ මා වට කරමින් ඔබගේ හස්තය මා පිට තැබූ සේක. මෙවැනි ඥානය මට අතිශයින් පුදුම ය, එය උසස් ය, ඊට ළඟා වෙන්නට නොහැකි වෙමි.
ඔබගේ ආත්මය කෙරෙන් කොතැනට යන්නෙම් ද? ඔබ ඉදිරියෙන් කොතැනට පලායන්නෙම් ද? මම ස්වර්ගයට නැඟුනෙම් නමුත් ඔබ එහි ය, මම පාතාලයට බසින්නෙම් නමුත් ඔබ එහි ය.
මා අරුණු පියාපතින් ගොස් මුහුදේ ඉතා දුර කෙළවර විසුවත් එහිදිත් ඔබගේ හස්තය මට මඟ පෙන්වන්නේය, ඔබගේ දකුණු හස්තය මා අල්ලන්නේය.
සැබවින්ම අන්ධකාරය මා වසා ගන්නේය මා වටකරින් වූ එළිය රාත්‍රිය වන්නේ යැයි කීයෙන් නමුත් අන්ධකාරය ඔබගෙන් කිසිවක් නොසඟවයි, රාත්‍රිය ද දවාල මෙන් බබලයි.
අන්ධකාරයත් එළියත් ඔබට එක සමාන ය.
මක්නිසා ද ඔබවහන්සේ මගේ හදවත හිමිකර ගත් සේක. ---
දෙවියන් වහන්ස, මා විමසා බලා මගේ සිත දැනගත මැනව.
මා පරීක්ෂාකොට මගේ සිතුවිලි දැනගත මැනව.
යම් නපුරු මාර්ගයක් මා තුළ ඇද්දැයි බලා ඔබගේ සදාකාල මාර්ගයෙහි මා ගෙන ගිය මැනව."

# පල දැරීම සඳහා ජීවිතය සරු පසක් ඇති බිමක් කර ගන්නේ කෙසේද?

## වපුරන්නා පිළිබඳ උපමාව

"ඒ ඒ නුවරින් මිනිසුන් ජේසුස් වහන්සේ වෙත පැමිණ මහා පිරිසක් රැස් වූ කල උන්වහන්සේ උපමාවකින් මෙසේ වදාළ සේක.

වපුරන්නෙක් බීජ වපුරන්නට නික්මිණි. ඔහු වපුරන කල බීජ සමහරක් මඟ දිගේ වැටී පයින් පෑගිණි. අහසේ කුරුල්ලෝ ඒවා අවුලා කෑහ. අන් සමහරක් ගල් බිමෙහි වැටී පැළ වූ කෙණෙහි ම දිය සීරාව නැති බැවින් වියළී ගියේය. අන් සමහරක් කටු පැළ අතර වැටිණි. කටු පැළ ද ඒ සමග ම වැඩී ඒවා යටපත් කර දැමීය. අන් සමහරක් සරු බිමේ වැටී පැළ වූ විට එකකින් සිය ගුණයක් අස්වැන්න ඇති විය. උන්වහන්සේ මෙසේ වදාරා තව දුරටත් සවන් ඇත්තෝ සවන් දෙත්වා යි හඬ නගා වදාළ සේක.

උන්වහන්සේගේ ශ්‍රාවකයෝ ඒ උපමාවේ තේරුම කිමෙක් දැයි උන්වහන්සේගෙන් විමසූහ. උන්වහන්සේ ඔවුන්ට මෙසේ වදාළ සේක. උපමාවේ තේරුම මේ ය. බීජ නම් දෙවියන් වහන්සේගේ වචනය ය. මඟ අසල වූවෝ නම් වචනය ඇසූ අය ය. එහෙත් ඔවුන් අදහා ගැළවීම නොලබන පිණිස නපුරා අවුත් ඔවුන්ගේ සිත්වලින් වචනය පැහැර ගන්නේය. ගල් බිමෙහි වූවෝ නම්, වචනය අසා සතුටින් පිළිගන්න නමුත් සිත්හි රූඩා නොපවතින බැවින් කලකට පමණක් අදහා පරීක්ෂා කාලයෙහි වැටී යන අය ය. කටු පැළ අතර වැටුණු බීජ යන්නෙන් අදහස් කරනුයේ වචනය අසා ජීවිතයේ කම්කටොලුවලින් ද ඉඳුරන් පිනවීමෙන් ද වචනය හිර වී සම්පූර්ණයෙන් පල නොදරන අය ය. සරු බිමේ වැපුරූ බීජ යන්නෙන් අදහස් කරනුයේ අවංක පිරිසිදු සිතකින් වචනය අසා, පිළිපැද, නොපසුබට වීර්යයෙන් පල දරන අය ය." (ලූක් 8: 4-15)

වපුරන්නාගේ උපමාව තුළින් ක්‍රිස්තුස් වහන්සේ අප වෙත ගෙනෙන්නෙ සදාතනික පණිවුඩයක්. දෙවියන් වහන්සේගේ වචනය නමැති බීජය, දහම් බීජය සරු පසක වැටුණොත් පමණයි, අස්වැන්නක් දෙන්නේ. මඟ දිගේ වැටුණු බීජත්, පස් අඩු ගල් පොළොවේ වැටුණු බීජත්, කටුපඳුරු අතර වැටුණු බීජත් අස්වැන්නක් ලබා දුන්නෙ නැහැ. දෙවියන් වහන්සේගේ වචනය නමැති බීජය, දහම් බීජය ඔබ තුළ වැඩී පල දරන්නට නම් ඔබගේ ජීවිතය සරු පසක් ඇති බිමක් විය යුතුමයි. අද පවතින සමාජ ආර්ථික දේශපාලන පසුබිම තුළ වැඩියෙන් දකින්න ලැබෙන්නෙ කටු පඳුරු සහිත බිමක් හා පස් අඩු ගල් පොළොව සහිත බිමක් වැනි ජීවිතයි. වචනය පල දැරිය හැකි සරු පසක් ඇති

බිමක් වැනි ජීවිත හරිම දුලබ වෙමින් තිබෙන්නේ. තම ජීවිතය සරු පසක් ඇති බිමක් කර ගන්නට අප එකිනෙකා විසින් කළ යුතු, කළ හැකි කොටසක් තිබෙනවා. ඒ පිළිබඳවයි, අප මෙහි දී අවධානය යොමු කරන්නට අදහස් කරන්නේ. දෙවියන් වහන්සේගේ වචනය නමැති බීජය ඔබ හද කෙතෙහි වපුරන්නට පෙර එය සරු පසක් ඇති බිමක් කර ගැනීම සඳහායි, මේ පොත් පිංච සකස් වන්නේ. අප එකිනෙකාගේ ජීවිතය සරු පසක් ඇති බිමක් කර ගැනීම සඳහා බලපාන කරුණු පහක් පිළිබඳව මා මෙහිදී ඔබගේ අවධානය යොමු කරන්නට බලාපොරොත්තු වෙනවා. මෙම කරුණු ඔබ හොඳින් අවබෝධ කරගෙන ඒවා ඔබ තුළ ගොඩනගා ගන්නට අවංකව උත්සාහ කළහොත් ඔබගේ ජීවිතය දහම් බීජය පල දරන සරු පසක් ඇති බිමක් වනු නොඅනුමානයි.

## අරමුණේ අවංකභාවය

ශු. බයිබලයේ පැරණි ගිවිසුමෙන් උපුටා ගත් කොටසක් ද නව ගිවිසුමෙන් උපුටා ගත් කොටසක් ද ඔබගේ අවධානය සඳහා ඔබ ඉදිරියේ තබන්නට මා අදහස් කරනවා. “මා ඔබට අද නියම කරන පණත දුෂ්කර එකක්වත් නුඹෙන් දුරස්තරව තිබෙන එකක්වත් නොවේ. එය ඇත්තේ අහසෙහි නොවේ. එබැවින් එය අසා ඉටු කරන පිණිස අප වෙත ගෙන එන්ට කවරෙක් අහසට නඟින්නේ ද කියා කිසිවකු විසින් හෝ කිවයුතු නැත. එය ඇත්තේ මුහුදින් එතෙර නොවේ. එබැවින් එය අසා ඉටු කරන පිණිස අප වෙත ගෙන එන්ට කවරෙක් මුහුද තරණය කරන්නේ ද කියා කිසිවකු විසින් හෝ කිවයුතු නැත. එහෙත් ඒ වචනය ඔබ ඉටු කරන පිණිස එය ඔබට ඉතා ළංව ඔබේ තොල් මත ද ඔබේ සිතෙහි ද ඇත්තේය.” (ද්විතීය 30: 11-14)

“මේ සභාවේ සේවකයකු වශයෙන් දෙවියන් වහන්සේ මා පත්කර ඔබේ යහපත උදෙසා මට වගකීමක් භාර දුන් සේක. ඒ වගකීම නම් දෙවියන් වහන්සේගේ පණිවුඩය සම්පූර්ණයෙන් ප්‍රකාශ කිරීම ය. ඒ පණිවුඩය යුග හා පරම්පරා ගණනාවක් තිස්සේ රහසක්ව සැඟවී තිබී දැන් උන්වහන්සේ සැදැහැවතුන්ට එය අනාවරණය කර ඇත. ඔවුන් හට එය අනාවරණය කරන ලද්දේ ඒ රහසේ තේජාන්විත සම්පත කුමක් ද කියා සකල ජාතින්ට දන්වන පිණිස ය. ඒ රහස නම් ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ වැඩවිසීමය. උන්වහන්සේ ඔබේ තේජාන්විත බලාපොරොත්තුව වන සේක. අප ප්‍රකාශ කරන්නේ ඒ ක්‍රිස්තුස් වහන්සේ ය.” (කොලොස්සි 1: 25-28)

දෙවියන් වහන්සේගේ වචනය ධර්මයාණන් හෙවත් මේ පොතේ පළමු කොටසේ විවිධ නම් රැසකින් හැඳින්වූ ඒ පරම සජීවි බලය අපට අති සමීප

බවත්, එතුමන් අප තුළ වැඩවසන බවත් ඉහත සඳහන් කියවීම් අපට වටහා දෙන්නට උත්සාහ කරනවා. මිනිස් බව ගත් හෙවත් මාංශගත වූ දෙවියන් වහන්සේගේ වචනය හෙවත් ධර්මයාණන් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ බවත් උන්වහන්සේ සියල්ලන් තුළ වැඩවසන බවත් මෙහි සඳහන් දෙවන කියවීම අපට පැහැදිලි කර දෙනවා. ඒ නිසා පරම සත්‍යය සොයා, දෙවිඳුන් සොයා අප විදෙස්ගත විය යුතු නැහැ, අභ්‍යවකාශගත විය යුතු නැහැ. එතුමන් ඇත්තේ අප තුළමයි.

අපගේ ආශ්වාස ප්‍රාශ්වාසය ගැන අතරින් පතරවත් අවධානය යොමු කරන එක වැදගත්. එවිට එය අපට බොහෝ දේ අවබෝධ කර දෙනවා. අපගේ ජීවිතයේ පැවැත්මට වාතය කොපමණ අවශ්‍යද කියන එක, අප උපන් මොහොතේ සිට මියැදෙන මොහොත දක්වා දිවා රැයේ සැම මොහොතකම අප වාතයෙන් ප්‍රයෝජන ලබන බව එවිට අපට වැටහෙනවා. වාතය සසල වෙද්දි එය සුළඟක් වශයෙන් අපට දැනෙනවා. සුළඟක් වශයෙන් නොදැනෙන මොහොතේ පවා නිරන්තරව අප තුළ අපෙන් පිටත වාතය පවතිනවා. ඔබෙත් මගෙත් දස දිශාවෙම වාතය තිබෙනවා. එපමණක් නොවෙයි, ඔබ තුළ මා තුළ සියල්ල හා සියල්ලන් තුළ වාතය තිබෙනවා. අපගේ සිරුර පුරා හැම ලේ බිඳුවකම වාතය තිබෙනවා. මිනිස් බව ගත් මැවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ හෙවත් ධර්මයාණෝ හෙවත් ධර්මකාය වාතය වගේම අපට අති සමීපයි. එතුමන් (එය) අප තුළ අපෙන් පිටත වැඩසිටිනවා.

මෙම පරම සත්‍යය හෙවත් ධර්මයාණන් හමුවීමෙන් පමණයි, එතුමන්ගේ (එහි) සියුම් හඬට අවනත වීමෙන් පමණයි, අප තුළ ප්‍රඥාකාය වැඩෙන්නෙ, අධ්‍යාත්මිකත්වය වැඩෙන්නෙ කියල අපි දන්නවා. එවිටයි, සදාතන යෞවනත්වය රැක ගනිමින් උඩුගං බලා පීනන්නට බලය ලැබෙන්නේ. මෙම අත්දැකීමෙන් බැහැර වීම නිසයි අද මිනිස් දිවිය මේ හැටි නිස්සාර වෙලා තියෙන්නෙ, උදාර මිනිස් බව මේ තරම් සෝදාපාළුවට ලක් වෙලා තියෙන්නේ. මහා පැවැත්මයාණන්, පරම සත්‍යය අපට මේ හැටි සමීප නම් අප තුළ අපෙන් පිටත පිරී වැඩසිටිනව නම් එතුමන් හමුවීම මේ මහා අත්දැකීමට පිවිසීම ඇයි අද මේ තරම් දුලබ දෙයක් වෙලා තියෙන්නෙ කියලා හිතා බලන එක හුඟක් වැදගත්.

ඒ සඳහා ශු. බයිබලයේ ප්‍රඥා පොතේ 6:16 වෙතට මා ඔබගේ අවධානය යොමු කරන්න අදහස් කරනවා. එහි මෙලෙස සඳහන් වෙනවා. "ඇය ලබා ගැනීමට සුදුසු අය සොයමින් ඇය සැරිසරනු ඇත. ඔවුන්ගේ සිත් සතන් තුළ ඇය ඔවුන්ට මුදු මොළොක් ලෙස ප්‍රකාශ වනු ඇත." මෙහි ඇය යනුවෙන් සඳහන් වන්නේ දෙවියන් වහන්සේගේ ප්‍රඥාවයි. "ඇය ලබා ගැනීමට

සුදුසු අය සොයමින් ඇය සැරිසරනවා.” යන යෙදුම දෙවියන් වහන්සේගේ බල මහිමය ප්‍රකාශ කරන්නෙ නැහැ කියල මට හිතෙනවා. ප්‍රඥා 6:16 ඉංග්‍රිසි බයිබලයේ සඳහන් වන්නේ මෙලෙසයි.

“She will be looking for those who are worthy of Her, and She will find you wherever you are. She is kind and will be with you in your every thought”

ඇය ලබා ගැනීමට සුදුසු අය කෙරෙහි ඇය නිරන්තර අවධානය යොමු කර තිබෙනවා. ඇය ලබා ගැනීමට ඔබ සුදුසු නම් ඔබ කොතැනක සිටියත් ඇය ඔබව සොයා ගන්නවා, ඇය වෙත ඔබ දිනා ගන්නවා. ඇය ඔබ කෙරෙහි කාරුණික වන අතර ඔබගේ සෑම සිතුවිල්ලක් තුළම ඇය ජීවත් වන්නට පටන් ගන්නවා. එම සත්‍යය වෙනත් වචනවලින් අපට මෙහෙම කියන්න පුළුවන්. ඇය ලබා ගන්නට ඔබ සුදුසු නම් ඔබ කොහේ සිටියත් ඇය ඔබව සොයා ගන්නවා. ඇය ඔබව ඇගේ නිවහන කර ගන්නවා. ඇය ඔබ තුළ නිවහන්ගත වී ඇයගේ ප්‍රඥාව ඔබට අනාවරණය කරන්නට පටන් ගන්නවා. එලෙසයි, කෙනෙක් තුළ ප්‍රඥාකාය වැඩෙන්නේ.

ප්‍රඥා තොමෝ ඇය ලබා ගැනීමට සුදුසු අයෙක් ඉන්නවද කියල නිරන්තර අවධානයෙන් සිටින්නේ. එනිසා ඇයගේ නිවහන වන්නට අප තුළ තිබිය යුතු සුදුසුකම මොකක්ද කියල සොයා බලන එක හුඟක් වැදගත්. ශු, බයිබලයේ 1සාමුවෙල් 16:7 මෙලෙස සඳහන් වී තිබෙනවා. “ස්වාමින් වහන්සේ මනුෂ්‍යයා බලන්නාක් මෙන් නොබලන සේක. මනුෂ්‍ය තෙමේ පිටාතර පෙනීම බලන්නේය. එහෙත් ස්වාමින් වහන්සේ සිත බලන සේක.” යමකට සුදුස්සෙක් තෝරා ගනිද්දි මනුෂ්‍යයා බොහෝ වෙලාවට පිටාතර පෙනීම තමයි බලන්නේ. කෙනෙකුගේ පෞරුෂය වුණත් බොහෝ දෙනා මනින්නෙ ඇඟපතෙන් හැඩ රුවින් විතරයි. එහෙත් දෙවිඳුන් උතුම් කාර්යයකට සුදුස්සෙකු සොයද්දි උන්වහන්සේ සිත දෙසයි බලන්නේ. අරමුණෝ අවංකභාවය ඇති හිතක් එතුමන් සොයනවා. එවැන්නෙක් හමුවුණොත් ප්‍රඥා තොමෝ එතැන තම නිවහන ඉදිකර ගන්නවා. කෙනෙකුගේ චේතනාව අවංක නම් අදෘශ්‍යමාන බලවේග ඔහුට උපකාරි වන බව බුදු දහමේ ද සඳහන් වී තිබෙනවා. මැවුම්කරුවාණන් නොපිළිගන්නා ථෙරවාදි බුදු දහම මෙයින් අදෘශ්‍යමාන බලවේග සිටින බව කියන්නට නොවෙයි, උත්සාහ කරන්නේ. කෙනෙක් අදෘශ්‍යමාන බලවේග ඉන්නවද නැද්ද කියල කරදර වන්න අවශ්‍ය නැති බවත් ඔහු කළ යුත්තේ තම චේතනා අවංක කර ගැනීම බවත් එවිට අදෘශ්‍යමාන බලවේග ඇත්නම් ඔහුට නිසැකව උපකාරි වන බවත් එයින් අපට ඉඟි කරනවා. ප්‍රඥාකාය වැඩෙනු සඳහා අප යෙදිය යුතු ජීවිත වන්දනා ගමන අන්ධකාරයේ ලෝක අධිපතීන්ට

විරුද්ධව නියැලිය යුතු නිරන්තර අරගලයක් බව පෙන්වා දෙන ශු පාවුලු තුමා ඒ සඳහා අප දෙවියන් වහන්සේගේ සන්නාහයෙන් සන්නද්ධ වන්නට එපිස 6: 14-18 තුළින් මෙලෙස ඇරයුම් කරනවා. "සත්‍යය නමැති පටියෙන් ඔබගේ ඉඟටිය බැඳ ගන්න. ----" එලෙසයි එතුමා එය මුලපුරන්නේ. ඉන්පසුවයි, එතුමා අති ප්‍රබල ආයුධ ගැන සඳහන් කරන්නේ. අරමුණේ අවංකභාවය නැත්නම් ඒ ප්‍රබල ආයුධ කිසිවකින් පලක් නොවන්න පුළුවන්. ශු. පාවුලු තුමා එයයි, අපට ඉඟි කරන්නේ. ඉහත සඳහන් වපුරන්නා පිළිබඳ උපමාවේදී ජේසු සමිඳුන් පැවසුවේ "අවංක පිරිසිදු සිතකින් වචනය අසා" යනුවෙනි. එය ද අරමුණේ අවංකභාවය ගැන ප්‍රකාශයකි.

පල දැරීම සඳහා ජිවිතය සරු පසක් ඇති බිමක් කර ගන්නට නම් අරමුණේ අවංකභාවය පිළිබඳ අපගේ අවධානය යොමු විය යුතුයි. මෙය පූජ්‍ය, පූජක, පැවදි, ගිහි සියලු දෙනාම මුහුණ දිය යුතු ප්‍රබල සත්‍යතාවයක්. දවස පුරා දහම පිළිබඳ කටයුතුවලම නියැලෙන තැනක කෙනෙකු පදිංචි වී සිටියත් අරමුණේ අවංකභාවය ඔහු තුළ නැත්නම් ධර්ම ඥානය කවදාවත් ඔහු තුළ රැඳෙන්නෙ නැහැ, ප්‍රඥාකාය ඔහු තුළ වැඩෙන්නෙ නැහැ. ප්‍රඥාව ඔහු තුළ නිවහන්ගත වන්නේ නැහැ. එය ව්‍යංජනය කොතෙක් ඇසුරු කළත් හැන්දට ව්‍යංජනයෙ රස තේරෙන්නෙ නැහැ වාගෙ දෙයක්. අරමුණේ අවංකභාවය ඔබ තුළ නැත්නම් මේ පොත් පිංචේ දෙවන කොටසේ පෙන්වන ඉතිරි කරුණු හතරෙන්ම ඔබ වර්ධනය වුණත් ප්‍රඥා තොමෝ ඔබ තුළ නිවහන්ගත වන්නෙ නැහැ. අරමුණේ අවංකභාවය ඔබ තුළ ඇත්නම් ඉතිරි කරුණු හතර අතින් ඔබ තුළ යම් ඌණතාවයක් පැවතුනත් ප්‍රඥා තොමෝ ඔබ තුළ නිවහන් ගතවනු නිසැකයි. මා මෙයින් ඔබට කියන්නට අදහස් කළේ අරමුණේ අවංකභාවය කොයි තරම් වැදගත් ද කියන එකයි. අරමුණේ අවංකභාවය ඔබ තුළ නැත්නම් ශුද්ධවූ ප්‍රභවයෙන් නික්මෙන ඒ සියුම් හඬ ඒ මඟ පෙන්වීම ලබන්නට නොහැකියි. අධ්‍යාත්මික ගමනේදී ඔබගේ අරමුණේ අවංකභාවයයි, නොමග යාමෙන් ඔබ වළක්වන පසුබිම් බලය වන්නේ. වෙනත් වචනවලින් කියනවා නම් ඔබගේ චේතනා අවංක නොවේ නම් ඔබ නොමග යාමෙන් වළක්වන්නට කිසි විටෙක බැහැ. ඔබගේ අරමුණ අවංක නම් ඔබ නාස්ති කර දමන්නට කිසි විටෙක බැහැ.

රටක යම් කිසි පිරිසක් හෝ ආධ්‍යාත්මිකත්වය පිළිබඳ විෂය ක්ෂේත්‍රයේම නියැලී සිටින බව පෙනුනත් බොහෝ අය තුළ අධ්‍යාත්මකාය හෙවත් ප්‍රඥාකාය නොවැඩෙන්නෙ, ඒ ජිවිත සමාජයේ උතුම් වෙනසක් සඳහා බලපෑමක් නොකරන්නෙ ඇයි කියන එක අප සිතා බැලිය යුතුයි. අධ්‍යාත්මිකව තමා කරන සියල්ලෙන් උත්සාහ කරන්නේ තමාගේ කැමැත්ත, ආශා ඉටුකර ගන්නට නම් තමාගේ අයිතිවාසිකම් රැක ගන්නට නම් එතැන

අධ්‍යාත්මිකත්වයක් ගොඩනැගෙන්නෙ නැහැ. එතැන ඇත්තේ ආත්මාර්ථයයි. ආත්මාර්ථයට මැරෙන්නට නම් එලෙස අධ්‍යාත්මිකත්වයට වැඩෙන්නට නම් තම ආශාවට, තම කැමැත්තට, තම අයිතිවාසිකම්වලට මරණයක් තිබිය යුතුයි. එවැනි තැනකින් පමණයි සැබෑ අධ්‍යාත්මිකත්වයක් නික්මෙන්නෙ. තමා අධ්‍යාත්මික නම් සියල්ල කළ යුත්තේ මිනිස් පවුලේ හිතසුව පිණිසයි. ඔවුන් නගා සිටුවනු පිණිසයි. තමාගේ හිතසුව සඳහා තමාගේ කීර්ති නාමය සඳහා නම් සියල්ල කරන්නේ එය අරමුණේ අවංකභාවයට මුළුමනින් පටහැනියි.

ඔබ තුළ ඇති පාපිෂ්ඨකම් ජඩකම් සියල්ල නසා නව මිනිසෙකු ලෙස නැගිටින්නට එලෙස සමාජයට පලදායි අයෙකු වන්නට ඔබ තුළ දැවෙන පිපාසයක් ඒ සඳහා අවංක මොරගැසීමක් ඇත්නම් ඔබගේ දුබලකම් කිසිවක් ඔබගේ අරමුණේ අවංකභාවය කෙළෙසා දමන්නෙ නැහැ. ශු. බයිබලයේ නව ගිවිසුමේ සංදේශ පත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීමේදී පෙනී යන කරුණක් තමයි, එදා කිතුනු නිකායන් වශයෙන් බෙදී නොසිටියත් කිතුනු සංඝය තුළ වැරදි ඉගැන්වීම් නොමග යාම් හා නොමග යැවීම් පිළිබඳ ගැටලු පැවති බව. කෙනෙක් තුළ අරමුණේ අවංකභාවය ඇත්නම් දෙවියන් වහන්සේගේ වචනය ඔහුට ගැළවීමේ මගක්. කෙනෙක් තුළ අරමුණේ අවංකභාවය නැත්නම් දේව වචනය වුනත් ඔහුට පැකිලීමේ ගලක්. ඔහු පැකිලී වැටෙමින් අනෙක් අයව ද වියවුල් කිරීම අනිවාර්යයෙන් සිදුවන දෙයක්. අදත් සමහර කිතුනු නිකායන් තුළ ඇති වියවුල මෙයයි. ඒ කිසිවකින් නාස්ති නොවන්නට නම් අරමුණේ අවංකභාවය රැක ගන්න.

## උසස් රසඥතාවයක් ඇති කර ගැනීම

ආගම් හා කලාවයි, කෙනෙකුගේ ප්‍රඥාකාය හෙවත් අධ්‍යාත්මකාය වැඩෙන්නට උපකාරි වන්නේ. අප මෙහි දී උත්සාහ කරන්නේ කෙනෙකුගේ ප්‍රඥාකාය වැඩෙන්නට කලාව විසින් කරන බලපෑම සොයා බැලීමයි. මහාචාර්ය ජේ. බී. දිසානායක සූරින්ගේ අදහසක් මා පළමුවෙන් ඔබ ඉදිරියේ තබන්න කැමතියි. "---- කිසියම් නිගමනයකට එළඹීම පිණිස ස්වකීය දැනුම තර්කානුකූලව හා ප්‍රායෝගිකව පාවිච්චි කරන පුද්ගලයා බුද්ධිමතෙක් ලෙස හඳුන්වන්න පුළුවන්. එහෙත් එලෙස එළඹෙන නිගමන හොඳ ද නරකද යන්න වෙනම ප්‍රශ්නයක්. ලොව පහළ වූ බුද්ධිමතුන් ස්වකීය බුද්ධිය මෙහෙයවීමෙන් මානව වර්ගයාගේ ප්‍රගමනයට රැකුල් වන දේවලුත් බාධා වන දේවලුත් කර තිබෙනවා. බුද්ධිය පාවිච්චි කරන ක්‍රමය මෙහි දී වැදගත් වෙනවා. මෙය තීරණය කරන්නේ ප්‍රඥාව විසින්. බුද්ධිමතෙකුට ස්වකීය බුද්ධිය නිවැරදිව පාවිච්චි කිරීමට කියා දෙන්නේ ප්‍රඥාව විසින්. එහෙත් මෙවැනි බුද්ධිමතුන් හිඟයි. අද සමාජයේ බහුලව දක්නට ලැබෙන්නේ කූට බුද්ධිමතුන්. උගත්කමක්

තිබූ පළියට කෙනෙක් බුද්ධිමතෙකු වන්නෙ නැහැ. අද සමහර උගත් අය මොන තරම් සමාජයට අයහපත් දේවල් කරනව ද? නූගතුන් අතරත් බුද්ධිමතුන් හා ප්‍රඥාවන්තයින් ඉන්නට පුළුවන්. ප්‍රඥාව පහළ වන්නේ උගත්කමින් නොවේ. මිනිසා තුළ හොඳ නරක පිළිබඳ දැනුමක් ඇති කරන්නෙත් ඔහු තුළ උත්තර මානවීය ගුණාංග වගා කරන්නෙත් ආගම හා සාහිත්‍යය විසින්. ප්‍රඥාවන්තයින් බිහිවන්නේ ඒ විදියටයි. සමාජයක් විනාශ මුඛය කරා සීඝ්‍රයෙන් ඇදී යන විට එම සමාජය ප්‍රපාතයට වැටීමෙන් ගළවා ගත හැක්කේ උගතුන්ට හෝ බුද්ධිමතුන්ට නොව ප්‍රඥාවන්තයින්ටයි'' (1992. 01. 19 - 'ලක්දිව')

සාහිත්‍යයෙන් කලාවෙන් සිදුවන සමාජ මෙහෙවර ඒ ඡේදයෙන් කදිමට නිරූපණය වෙනවා. කලාව විශ්ව ආගමක් ලෙස විද්වතුන් හඳුන්වා දී තිබෙනවා. ඒ සියලු දෙනාටම පොදු සියල්ලන් උසස් කරන ආගමක්. කලා කෘතිවල ගුණාත්මක අගය අනුව අවර කලාව, මධ්‍යම කලාව හා උත්තම කලාව වශයෙන් වර්ග තුනකට බෙදන්න පුළුවන්. උත්තම කලාවයි, විශ්ව ආගමක් වන්නේ. උත්තම කලාවයි කෙනෙකුගේ ප්‍රඥාකාය වැඩෙන්නට උපකාරි වන්නේ. උත්තම කලාව මානව භක්තියෙන් ඔප්නැංවුණු දෙයක්. මුළු මිනිස් වර්ගයා ඒකරාශි කරන බලයක් එහි ගැබ්ව තිබෙනවා. පටු ජාතිවාදි ආගම්වාදි හැඟීම් දුරු කරමින් එය මිනිස් පවුල ආදරයෙන් වැළඳ ගන්නවා. ඒ පිළිබඳව මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ අදහසක් මා ඔබ ඉදිරියේ තබන්න කැමතියි.

''---- රසික සහෘද සිත් කම්පා කරවන සාහිත්‍යය ඒ සිත් මුදු මොළොක් බවට පමුණුවයි. එකිනෙකා කෙරෙහි ඊර්ෂ්‍යා පරවශව ද්වේශ පරවශව වාසය නොකොට ඔවුනොවුන් කෙරෙහි සානුකම්පික හැඟුමෙන් යුතුව ජිවත් වන්නට පෙළඹුමක් සාහිත්‍යයෙන් ලැබේ. ---- සාහිත්‍යය මිනිසා අවනත කර ගන්නේ ඔහුට අණ කොට තරවටු කොට නොව ඔහුගේ සිත උණු කොට ය, කම්පා කොට ය. ඔවුනොවුන් කෙරෙහි වෛර චෛතසිකයෙන් ක්‍රියා කරන්නට අනුබල සපයනු වෙනුවට ඔවුනොවුන් කෙරෙහි ආදරයෙන් හා දයාර්ද්‍ර හැඟුමෙන් යුතුව පවතින්නට අනුබල දීම නොවේද, වඩා උතුම් වන්නේ? ඒ අනුබලයයි, සාහිත්‍යයෙන් ලැබෙන්නේ.'' (1992.09.20 -'සිළුමිණ')

උත්තම කලාව යනු අවවාද අනුශාසනා නොවේ. එය ශ්‍රේෂ්ඨ නිර්මාණයක්. එය වේදයිතයක් ලෙස හඳුන්වා දෙන ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් ඒ ගැන 'කෝමල රේඛා' පොතේ මෙලෙස පවසනවා. ''වේදයිතය යන්නෙහි කෙටි තේරුම විඳිය යුතු දෙය යනුයි. වේදයිතය කියන්නේ වින්දනයක් ගෙන දෙන හැඟීමක් පහළ කළ හැකි කරුණුවලටය. ජීවිතය

හසුරුවනු ලබන ආශ්චර්යවත් බලය ඇත්තේ වේදයිතය තුළය.''

"මැරී වැටෙන සේ කිරිල්ලියකට ගලකින් ගැසූ ළමයකු අමතා චී පුතා මීට පස්සේ සතුන් මරන්න එපා. අනිත් ජාතියෙදි නරකාදි යන්න වෙයි. මහ පව්කාර ළමයෙක්ය කියල මිනිසුන්ගෙන් බැණුම් අහන්න වෙයි යනුවෙන් මවක් අවවාද කරයි. පියා ඉපලක් ගෙන නැවත සතුන් නොමරන සේ තරවටු කරයි. ඉන්පසු ඒ ළමයා සතුන් නොමරන්නේ අපායටත් නරක නාමයටත් තම පියාටත් ඇති බිය නිසාය. කලකදී මේ තුන් බියම නැතිව යන්නට ඉඩ තිබේ. ---- මෙසේ නැතිව වේදයිතයක් මගින් කුරුල්ලන් කෙරෙහි දයාබර හැඟීමක් ඒ දරුවාගේ සිතෙහි ඇති කළ නොහැකිද? අනේ මේ කිරිල්ලි ආවෙ පැටවුන්ට කෑම සොයන්න වෙන්නට ඇති. ඉතින් කෝ උන්ට ගොදුරු? උන් බඩගින්නෙ බලාගෙන ඇති. ඉතින් උන්ට කවන්නට කෝ අම්මා? අතු රිකිල්ලක් හෙළවෙන කොට අහලින් කුරුල්ලෙකුගෙ පිහාටුවක් හෙළවෙන හඬක් ඇහෙන කොට අම්ම ආවා තමයි කියල හිතාගෙන උන්ගෙ පුංචි හොටවල් ඇරගෙන 'කුවු කුවු' ගානව ඇති. රෑ වුණාම තමයි හරිම දුක. තුරුළු කරගෙන උණුහුම් කර නිදාගන්නට කෝ ඉතින් අම්මා? ඔහොම දවස් කීයක් ඉන්නද? උන්ගේ දුක කියන්නෙ කාටද? අම්ම ඉද්දි වගේ ගොදුරු කාල බඩ පුරවා ගෙන උණුහුම් වෙලා ඉන්න ආයෙත් ලැබෙනවයැ. අනේ කිරිල්ලිගෙ හුස්ම යද්දි පැටව් ගැන මතක් වෙන්න ඇති, යනුවෙන් පුතා අමතා මව කීයේ නම් ළමා සිතෙහි විඳීමක් ඇති වෙයි. මව් කිරිල්ලිය එන තෙක් නොඉවසිල්ලේ පුංචි හොටය ඇරගෙන 'කුවු කුවු' ගගා සිටින අහිංසක කුරුළු පැටියා බවට ඔහු එවලේම පෙරළෙනවා ඇත. හිස් අහසත්, අසරණ බවත්, කුසගින්නත් අතර අනාථ වූ කුරුළු පැටියාගේ දුක හෙතෙම සිතින් විඳ ගනී. ඉන්පසු ඔහුගේ නෙත්වලට කඳුළු බිඳු නැගෙනවා ඇත. ඒ කඳුළුවල මුළු ජීවිතය හික්මවනු ලබන බලවේගයක් ඇත්තේය.'' ('කෝමල රේඛා')

සත්‍යයෙන් බිඳක් හෝ හමුවෙද්දි ආනන්දයෙන් බිඳක් හමුවන විදියටයි මැවුම්කරුවාණන් මේ මැවිල්ල සැලසුම් කරල තියෙන්නේ. ඒ අනුව බලද්දි බටහිර ශ්‍රේෂ්ඨ කලා විචාරකයකු වන ඊ. ඇම්. ෆොස්ටර්ගේ පහත සඳහන් ප්‍රකාශනය අර්ථවත්. "සැම කලා නිර්මාණයක්ම ආනන්දයෙන් ඇරඹී ප්‍රඥාවෙන් අවසන් විය යුතුය.'' "සත්‍යයේ දිළිසීම සත්‍යයේ බැබලීම සෞන්දර්යය'' හැටියටයි විස්තර වන්නේ. සත්‍යය, පරමානන්දය, ප්‍රඥාව, සත්‍යයේ බැබලීම, සෞන්දර්යය මේවා කොපමණ උතුම්ද? රට, ලොව උසස් කරන්නට මිනිස් වර්ගයා ඒකරාශි කරන්නට කවර යුගයක හෝ අවශ්‍ය වන්නේ මේවාම නොවේද කියල අප වැඩි වැඩියෙන් සිතා බැලිය යුතු කාලයක්, මෙය. ප්‍රීතිය ලෞකික දේ තුළින් ද ලබාගත හැකියි. ප්‍රඥාව තුළින්, අධ්‍යාත්මිකත්වය තුළින් පමණක් ලබාගත හැකි සැබෑ සතුටටයි ආනන්දය කියන්නෙ.

පරමානන්දය යනු එහි උතුම්ම තත්ත්වයයි.

උත්තම කලාවෙහි නියැලෙන සැබෑ කවියෙක් කලාකරුවෙක් සොබාදහමට නිශ්චලතාවයට, සරල අල්පේච්ඡ ජීවිතයට ඇලුම් කරනවා. එනිසා එවැන්නෙක් පරම සත්‍යයට, ධර්මකායට සමීපයි. එවැන්නෙක් නිහැඬියාව තුළ සිත එක්තැන් කර ගනිද්දි ඔහුගේ ව්‍යවහාර ඥානයම නොවෙයි, පරම යථාර්ථය සතු ප්‍රඥාවයි ඔහු තුළට ඔහුගේ නිර්මාණය තුළට ගලා එන්නෙ. එම නිර්මාණය (උත්තම කලාව) අපගේ ප්‍රඥාකාය වැඩෙන්නට උපකාරි වීමේ රහස එයයි.

කෙනෙක් සෞන්දර්යය පිළිබඳ ජීවිත වන්දනා ගමන අවර කලාවෙන් මුල පුරන්න පුළුවන්. එහෙත් ඔහු වැඩෙද්දි කෙමෙන් උත්තම කලාවට පිවිසෙන්න ඕනෑ, උත්තම කලාව රස විඳින්න පුළුවන් අයෙක් වන්න ඕනෑ. රසිකයෙක් වන්න කාටත් පුළුවන්. එහෙත් සහෘදයෙක් වන්න පුහුණුවක් අවශ්‍යයි. සහෘදයෙක් වීම යනු සම හෘදයක් ඇතිකර ගැනීමයි. උත්තම කලාවෙන් රස විඳින්නට නම් එමගින් ප්‍රඥාව ලබා ගන්නට නම් කවියා හා සම හෘදයක් ඇතිකර ගත යුතුයි. උත්තම කලාව සියුම් මනසක් හෙවත් සංවේදීතාවයක් අප තුළ ඇති කරනවා. සූක්ෂ්මාත්මතාවය කියන්නෙත් එවැන්නක්. පරම සත්‍යය විසින් ධර්මකාය විසින් මැවුම්කරුවාණන් විසින් අපට පෙරටුව කරන සියුම් මඟ පෙන්වීමට විවෘතව ඒ මඟ පෙන්වීම හැඳින ගන්නට නම් උත්තම කලාව තුළින් කෙනෙක් තුළ වැඩෙන සංවේදී බව සූක්ෂ්මාත්මතාවය අවශ්‍යමයි.

ඒ ඇයි? අවර ගනයේ නිර්මාණයක අදහස් ප්‍රකාශනය බොහෝ විට ගොරෝසුයි, දඬබ්බරයි. එහෙත් උත්තම කලාවේදී හැඟීම් ප්‍රකාශනය, සංනිවේදනය සියුම්. මැවුම්කරුවාණන් කියන්නෙ විශ්ව සෞන්දර්යයේ නිර්මාතෘවරයාණෝ. එනිසා විශ්ව කලාකරු ජගත් කවියා එතුමන්මයි. උත්තම කලාවේ සංනිවේදනය සියුම් නම් විශ්ව කලාකරුවාණන්ගේ සංනිවේදනය අතිශයින්ම සියුම්. එය හසුකර ගත හැක්කේ සංවේදි මනසක් ඇති අයෙකුට පමණයි. ඒ නිසයි ජීවිතය සරු පසක් ඇති බිමක් කර ගැනීම සඳහා උසස් රසඥතාවයක් ඇති අයෙක් විය යුත්තේ.

බොහෝ දෙනා හිතාගෙන ඉන්නෙ මැවුම්කරු කුණාටු භූමිකම්පා වැනි මහා පරිමාන මට්ටමේ දේ තුළින් පමණක් මිනිසාට කතා කරනව කියලයි. සැබවින්ම විශ්ව කලාකරුවාණන් රිසි නැහැ, එලෙස අපට කතා කරන්නට. එහෙත් මිනිස් වර්ගයා එතුමන්ගේ සියුම් මඟ පෙන්වීම් ඉදිරියේ අන්ධයන් බිහිරන් මෙන් හැසිරෙද්දි ප්‍රේමය නිසාම අතරින්-පතර හෝ කුණාටු, භූමිකම්පා

වැනි සංවේදි නොවන අයට පවා දැනෙන ගොරෝසු මාධ්‍යයන්ගෙන් ඔවුන් අමතන්නට එතුමන්ට සිදුවෙනවා. එතුමන්ගේ අති සියුම් සංනිවේදනයට අප සංවේදිව සිටිනවා දකින්නටයි සැබවින්ම එතුමන් රිසි වන්නේ. එනිසා උත්තම කලාව තුළින් අපි සංවේදි මනසක් ගොඩනගා ගන්න ඕනැ.

ධර්මකාය හෙවත් ධර්මයාණන් නමැති ශුද්ධවූ ප්‍රභවයෙන් උල්පතෙන් නික්මෙන අනාවරණය හා බලය අත්දැකීමයි, යුගයේ අභියෝගයන් අභිබවා යාමට හැකි පරපුරක් බිහි කරන්නේ. ආගම්වල මූලික කාර්යභාරය එයයි. එවැන්නක නියැලෙනවා වෙනුවට ආගම් අවවාද අනුශාසනා දීමකට සුචරිත වාදයකට පමණක් සීමා වුවහොත් එවිට ආගම්වල දැනට පවතින ප්‍රායෝගික මට්ටම ගුණාත්මක අතින් බලද්දි උත්තම කලාවට වඩා හීන මට්ටමකට ඇදවැටෙනවා. (එය කවදාවත් අවර කලාවේ මට්ටමට ඇදවැටෙන්නෙ නැහැ. එය මධ්‍යම කලාවේ මට්ටමට පිවිසීමක් සිදුවන්නෙ. එය අවවාද අනුශාසනා දීමේ කලාවක්.) උත්තම කලාවටත් වඩා පෙරටුවෙන් සිටිය යුතු ආගම් ඒ තත්ත්වයට ඇදවැටීම කණගාටුවට කරුණක්.

ආගම්වල එවැනි පිරිහීමක් දැකිය හැකි මෙම යුගයේ දී රටේ සිසු පරපුර, තරුණ පරපුර ඇතුලු සියලු දෙනා උත්තම කලාවෙන් සම්භාව්‍ය සාහිත්‍යයෙන් පෝෂණය ලැබූ පෝෂණය ලබන ජනතාවක් වුණා නම් රට මෙවැනි ශෝචනීය තත්ත්වයකට ඇදවැටෙන්නෙ නැහැ. අද රටේ පවතින ප්‍රබල සංනිවේදන මාධ්‍යයන් යුගයේ අභියෝග ජය ගැනීමට අවශ්‍ය ප්‍රඥාව සම්පාදනය කරන්නෙ නැහැ. එවැනි මාධ්‍යයන් තුළින් ප්‍රඥාව බිඳක් හෝ සොයා ගන්න එක හුඟක් අපහසු දෙයක් වී තිබෙනවා. එහෙත් පල දරන ජීවිතයක් සඳහා ඔබගේ ජිවිතය සරු පසක් ඇති බිමක් කර ගන්නට උත්තම කලාව තුළින් සංවේදි මනසක් හදා වඩා ගත යුතු බව දැන් ඔබට පැහැදිළි නම් ඊට අවස්ථාව සොයා ගැනීම ඔබ එකිනෙකා විසින්ම කළ යුතු දෙයක්. අවශ්‍යතාවය ඇත්නම් ඒ අරමුණ කරා වැඩීම ඔබට අපහසු නැහැ.

රසඥතාවය පිළිබඳ වඩාත් ගැඹුරු අධ්‍යයනයක යෙදෙන්නට සූදානම් අය ඇත්නම් ඔවුන් වෙනුවෙන් තවත් අදහස් ස්වල්පයක් මා සටහන් කරන්නට කැමතියි. පරම සත්‍යය, ධර්මකාය හෙවත් මැවුම්කරුවාණන් අබියස ගෞරවයෙන් සිටිම, එතුමන්ට (එයට) විවෘත වීම එතුමන්ගේ (එහි) මෙහෙයවීම හැඳින ගැනීම ඊට නිසි ප්‍රතිචාර දැක්වීම මා දකින්නෙ රසඥතාවය වඩා උසස් වීමේ පියවරක් හැටියටයි. ප්‍රකෘතිය හෙවත් ප්‍රකෘති සත්‍යය අත්දැකීම යනු ඒ අත්දැකීමට පිවිසීමයි, එහි මුහුකුරා යාමයි. මහගම සේකර කවියාණන්ගේ 'ප්‍රබුද්ධ' කාව්‍යයෙන් උපුටා ගත් පහත සඳහන් අදහස ඒ පිළිබඳ ඔබගේ නිම්වළලු පුළුල් කරනු නිසැකයි.

"කලාව සත්‍යය හා මිථ්‍යාවය
සත්‍යය ප්‍රකෘතියය
ප්‍රකෘතිය තරම් සුන්දර වූ කිසිවක්
කිසි දවසක මිනිසා හට මැවිය නොහැක.
ඒ සුන්දර බව හරි හැටි දකින්නට බැරි
දුහුනන්ටය කලාව.
ඒ සුන්දර බව රැකුලක් වේ,
බලගතු භාවනායෝගියාට.

මවනා විඳිනා ශක්තිය රසිකත්වය
මුහුකුරා ගිය රසිකයා හට
නොරිසි වෙයි නොසියුම් කලා කෘති.
උසස්තම නිර්මාණයෙන් මිස
එවිට රසයක් ඔහුට නොලැබෙයි.

ඒ ශක්තිය උපරිම තලයට පත් විට
කලා නිර්මාණයත්
කලා රස විඳීමත්
දෙකම ඔහු අත් හරී.

කලාව බොළඳ දෙයකි
එවිට ඔහුට හැඟෙයි.
කලාව බොළඳ දෙයකි
ඒ නිසා එය බැහැර කරයි.

ඉන්පසු ඔහු සෞන්දර්ය ප්‍රවාහයකි.
මහා මෛත්‍රී කරුණා නිධානයකි.
කලාවේ අග්‍ර ඵලය ය එය,
ඉතා දුර ගමනක් ය එය"

ඛලිල් ජිබ්රාන් කවියාණන්ගේ පහත සඳහන් අදහස ද එම සත්‍යයම ඔබ තුළ තහවුරු කරනු ඇත. "දෙවියන්ගේ පරාවර්ථනයන් වන ආදරයත් අලංකාරයත් තුළ ජීවත් වීම පිණිස මම පැමිණියෙමි. මම මෙහි ජීවත් වෙමි. --- ඔවුන් මගේ ඇස් ගලවා ගතහොත් ආදරයේ කෙඳිරිල්ලටත් අලංකාරයේ ගීතයටත් මම කන් දෙමි. ඔවුන් මගේ කන් වසා දැමුවොත් ආදරයේ සහ අලංකාරයේ සුවඳ ගෙන එන මඳ සුළඟේ ස්පර්ශය ලබා මම සැනසෙමි. සුළඟක් පවා නැති ශූන්‍ය තැනකට ඔවුන් මා පත් කළහොත් ආදරයේ සහ

අලංකාරයේ දරුවා වන ආත්මයත් සමග මම ජීවත් වෙමි. මා මෙහි පැමිණියේ සියල්ලන් වෙනුවෙන් සියල්ලන් සමග ජීවත් වීමටය.'' ('දෙව්දුරු අරටු')

## ඔබ උපන් බිමෙහිම පැළ වන්න.

පෘථිවිතලය පුරා විසිරී පැතිරී සිටින සියල්ලන් එකම මිනිස් ජාතියටයි අයත් වන්නේ. පාට හැඩරුවින් එය කිසිසේත් වෙනස් වන්නෙ නැහැ. කිතු දහමට අනුව මනුෂ්‍ය ජාතියට අයිති සියල්ලන් මැවුම්කරුවාණන් වන එකම දෙවියන් වහන්සේගේ මැවීමක්. එනිසා උන්වහන්සෙයි සියල්ලන්ගේ පියාණොත්, මෑණියොත්. හැම මනුෂ්‍යයෙක්ම උන්වහන්සේගේ දූ පුතුන්. එනිසා මනුෂ්‍ය ජාතියට අයිති සියල්ලන් සහෝදර සහෝදරියො. මනුෂ්‍ය ජාතියට අයත් සියල්ලන් පෘථිවිතලයේ විවිධ මහාද්වීපවල විවිධ රටවල ජීවත් වෙනවා. මෙලොව උපදින හැම මනුෂ්‍යයෙකුටම වාගෙ තම නිජබිම ලෙස හඳුන්වන්න පුළුවන් රටක් තිබෙනවා. තමා උපදින රට කිසිවෙක් කිසිසේත්ම තමාගේ කැමැත්තෙන් කළ තෝරා ගැනීමක් නොවෙයි. එය මැවුම්කරුවාණන් වහන්සේගේ ශුද්ධවූ අභිරහසේ කොටසක්. එනිසාම එම තීරණයට අප ගරු කළ යුතුයි. මා ශ්‍රී ලංකාවේ උපත ලබන්නේ මා මේ දේශයට අවශ්‍ය නිසයි, රටට ලෝකයට මගෙන් සිදුවිය යුතු දූතමෙහෙයක් ඇති නිසයි. හැම රටකම උපදින හැම දෙනා ගැනම එය සත්‍යයක්. මනුෂ්‍ය ජීවිතය දෙවියන් වහන්සේගේ මැවීමක් නිසා උතුම් මනුෂ්‍යයො පහත් මනුෂ්‍යයො කියල දෙකොටසක් නැහැ. හැම මනුෂ්‍ය ජීවිතයක්ම දෙවියන් වහන්සේගේ මැවීමක් නිසා උතුම්.

මා උපන් දේශය තුළ මට අදාළ මව්බසක් තිබෙනවා. හැම දෙනා ගැනම එය සත්‍යයක්. ඒ මව්බස හා බැඳුණු සංස්කෘතික උරුමයක්, ඓතිහාසික උරුමයක් සාහිත්‍යය ඇතුළු කලා ශිල්ප උරුමයක් තිබෙනවා. ඒ පලදායි උරුමයට මුල්ඇද පැවතිය යුතු බවයි, එම උරුමයෙන් පෝෂණය විය යුතු බවයි නිජබිමෙහිම පැළ වන්න කීමෙන් මා අදහස් කරන්නේ. එසේ නොවුනොත් එය මුල් සිඳගත් ජීවිතයක් වෙනවා. "දෙඇස් අහසට දෙපා පොළොවට" කියල කතාවක් තිබෙනවා. දෙඇස් අහසට හෙවත් ධර්මයාණන්ගේ සියුම් මෙහෙයවීම දෙසට තබා ගන්න එක වැදගත්. එය ගසකට හිරු එළිය හා වාතය වාගෙ. එසේම දෙපා පොළොවට හෙවත් රටේ ලොවේ උරුමයට මුල්ඇද පැවතීම වැදගත්. එය ගසකට ජලය හා පොහොර වාගෙ. එලෙසයි, පලදායි ජීවිතයක් බිහි වන්නේ. එනිසා උපන් රටට හා එහි උරුමයට අති විශේෂ ආකාරයෙනුත් මුළු ලොවට හා මුළු මානව උරුමයට විශේෂ ආකාරයෙනුත් අප මුල්ඇද පවතින්නට අවශ්‍යයි.

තම නිජබිමෙහිම පැළ වන්න, එහිම මුල්ඇද පවතින්න කීම හැම ජීවිතයකටම අදාල පොදු සත්‍යයක්. පලදායි ජීවිතයක් සඳහා එය අත්‍යවශ්‍යයි. එසේම තම නිජබිමෙහිම පැළ වන්න, පිපෙන්න පල දරන්න කීම බොහෝ ජීවිත පිළිබඳව අදාල දෙයක් වන්න පුළුවන්. එහෙත් හැම ජීවිතයක් සම්බන්ධයෙන්ම එය අදාල වන්නෙ නැහැ. සමහර ජීවිත තම නිජබිමෙහිම පැළවුනත් එහි මුල්ඇද ගත්තත් එය පිපෙන්නෙ පල දරන්නෙ වෙනත් රටක වෙනත් ජන කොටසක් අතර වන්න පුළුවන්. එය ද දෙවියන් වහන්සේගේ ශුද්ධවූ අභිරහස හා බැඳුණු සත්‍යයක්. එනිසා අප එයට ද ගරු කළ යුතුයි. රටවල් වශයෙන් අප වෙන්ව ජීවත් වුනත් සියල්ලන් එකම මනුෂ්‍ය ජාතිය නිසා විශ්ව සහෝදරත්වය රැක ගන්නට සමත් විය යුතුයි. ලොව පුරා ඇති උත්තම කලා කෘති තුළින් අප පෝෂණය ලබන තරමට සියල්ලන් ඒකරාශි කරන්නට සුසංගමයට පමුණුවන්නට හැකි වෙනවා. පටු ජාතිවාදි හැඟීම් තුළ කොටු නොවන්නට එයින් නාස්ති නොවන්නට දූපත් මානසිකත්වයක් තුළ පටු නොවන්නට ඒ උත්තම කලා කෘති අපට උපකාරි වෙනවා. රටක විවිධ ජාතින් හා ආගම් පිළිබඳ ගැටළු නිසි ලෙස කළමනාකරණය කර ගැනීම රටක සංවර්ධනයට හේතු වෙනවා.

රටක සංස්කෘතික ඓතිහාසික උරුමයට මුල්ඇද පැවතීමේ එයින් පෝෂණය වීමේ තවත් අගයක් තිබෙනවා. ඒ උරුමයට මුල්ඇද පවතින තරමට එයින් පෝෂණය ලබන තරමට තමයි කෙනෙක් තුළ විශේෂ අනන්‍යතාවයක් ගොඩනැගෙන්නෙ. ඒ අනන්‍යතාවය ලෝක සංස්කෘතිය තුළට ගෙන යාමෙන් තමයි, ලෝක සංස්කෘතිය තව තවත් පෝෂණය වන්නේ. තම නිජබිම උරුමයට මුල්ඇද පැවතීමේ තවත් අගයක් තිබෙනවා. උත්තම කලා කෘතියක් බිහි වීමට එය අවශ්‍යයි. අපි උදාහරණයක් ඇසුරෙන් එය වටහා ගනිමු. සත්‍යජිත් රායිගේ පාතර්පංචාලි, අපරාජිතෝ, අපූර් සංසාර් චිත්‍රපටි ත්‍රිත්වය උත්තම කලා කෘතියක්. උත්තම කලා කෘතියක් තුළ සර්ව කාලින සර්ව දේශිය හෙවත් විශ්වව්‍යාපි ගුණාංග අන්තර්ගත විය යුතුමයි. උත්තම කලා කෘතියක් වීමට එපමණක් ප්‍රමාණවත් වන්නෙ නැහැ. ඒ චිත්‍රපටියට පසුබිම් වන බෙංගාලි ජන ජීවිතයේ පුසුඹ එයින් වහනය වන්නට ඕනැ, එහි සංස්කෘතික ලක්ෂණ ආදිය කදිමට දිස්වන්නට ඕනැ. එය සිදුවන්නෙ නිජබිම උරුමයට මුල්ඇද පවතින තරමටයි.

## සිතුවිලි තුළ නම්‍යතාවය රැක ගැනීම

ධර්මකාය හෙවත් මැවුම්කරුවාණන් ප්‍රඥාවේ උල්පතයි. එනිසා ප්‍රඥාවේ උල්පත අබියස ගෞරවයෙන් සිටින්නට අප ඉගෙනගත යුතු වෙනවා. සෑම දිනකම දවසේ සුළු මොහොතක් හෝ ප්‍රඥාවේ උල්පත අබියස

ගෞරවයෙන් සිටීම අප අභ්‍යාස කරන එක වැදගත්. එසේ අභ්‍යාස කිරීමේදී අප දැනගත යුතුයි, අපගේ සෑම සිතුවිල්ලක්ම අපගේ සෑම වචනයක් හා ක්‍රියාවක්ම ප්‍රඥාවේ උල්පතින් සැඟවී නැති බව. පුංචි දරුවෙකු මවගේ හෝ පියාගේ තුරුලේ ඉන්න ඉරියව්වෙන් අපිත් ප්‍රඥාවේ උල්පත අබියස නැවතී සිටින්න ඉගෙනගත යුතුයි. ප්‍රඥාවේ උල්පත අබියස ප්‍රඥාව ලබාගන්න ඉරියව්වෙන් නැවතී සිටින එක වැදගත්. ඒ පිළිබඳවයි, අප මෙහිදී සොයා බලන්නට උත්සාහ කරන්නෙ. අප සැම දෙනෙක්ම මිය යන මොහොත දක්වා ඉගෙන ගත යුතු වෙනවා. වඩාත් ඈතට ඉගෙන ගනිද්දි අපට අවබෝධ වෙනවා අප දන්නා දෙයට වඩා නොදන්නා කොටස විශාල බව. අපරිමිත විශ්වයේ දූවිලි අංශුවකටත් වඩා තමා අල්ප බව. එය අප තුළ බැහැපත් නිහතමානි හිතක් ඇති කරනවා. බැහැපත්කම ප්‍රඥාව අප වෙත ඇදගන්නා කාන්දමක් වාගෙ.

ප්‍රඥාව ලබා ගැනීමට අවශ්‍ය වන නිහතමානි හිතක් ගැනයි අප කතා කරමින් සිටින්නෙ. සිතුවිලි තුළ ඇති නම්‍යතාවය හෙවත් පහසුවෙන් නැමෙන සුළු බව, බැහැපත් සිතක මූලික ලක්ෂණයක්. ප්‍රඥාවේ උල්පත කුඹල්කරුවා නම් අප ඒ අබියස මැටි පිඬක් මෙන් සිටිය යුතු වෙනවා. මැටි පිඬක් කියන්නෙ ඕනෑම අතකට හැඩ ගසන්නට හැකි පහසුවෙන් නැමෙනසුළු දෙයක්. එවිට ප්‍රඥා තොමෝ එය හැඩගසා ගන්නවා ඇයට රිසි ලෙස හා ලොවට පලදායි ලෙස. යමක් පිළිබඳව යමෙක් ඔබගේ අදහස් විමසුවොත් සැබවින්ම අදහස් ප්‍රකාශ කරන්නට තරම් ඔබ එය අධ්‍යයනය කරල මදි නම් ඒ බව අවංකව පිළිගැනීම හුඟක් වැදගත් දෙයක්. එය නිහතමානී ජීවිතයකට අවශ්‍ය වැදගත් ලක්ෂණයක්. අද හැම කෙනෙක්ම හැම දෙයක් ගැනම ඔහෙ උඩින් පල්ලෙන් අදහස් ප්‍රකාශ කරන්නට යාමෙන් සමාජය අවුලක් බවට පත්වෙලයි තියෙන්නෙ. ප්‍රඥාවේ උල්පත විසින් අප අබියස තබා ඇත්තේ මුළු ජීවිත කාලය තුළ හෝ ගවේශණය කර නිමාවක් කළ නොහැකි අසීමිත යථාර්ථයක්. කෙනෙක් හිතුවොත් යමක් ගැන තමා සම්පූර්ණයෙන් දන්නව ඒ ගැන කිසිවකුගෙන් ඉගෙන ගන්න දෙයක් තමාට නැහැ  කියල, එය ප්‍රඥාවේ උල්පත අබියස තමා ආබාධිත තත්ත්වයකට පත්වීමක්. අප කිසි දා ඒ විපතට නොවැටෙන්නට පරෙස්සම් වන්න ඕනැ.

ඕනෑම දෙයක් පිළිබඳව එකිනෙකා තුළ විවිධ මත පැවතීම අප බලාපොරොත්තු විය යුතු දෙයක්. සත්‍යාවබෝධය සඳහා ඒ මත පිළිබඳව ද අප නම්‍යතාවයෙන් සිටිය යුතු වෙනවා. අපේ රටේ දැන් ඇති අවුල් විසඳාගෙන මීට වඩා ජීවත් වන්නට සුදුසු රටක් බවට පත්විය හැක්කේ කෙසේද කියන ප්‍රශ්නය නැඟුවොත් එයට බොහෝ දෙනා දෙන විවිධ පිළිතුරු තියෙනවා. ප්‍රඥාවේ උල්පත විසින් අනුමත කරන නිවැරදිම පිළිතුර සොයා

ගැනීමට නම් ඔබ ප්‍රඥාවේ උල්පත අබියස නම්‍යතාවයෙන් සිටිය යුතුයි. ඔබ නම්‍යතාවය හඳුනන අයෙක් නම් ඉහත මතුකළ ගැටළුව පිළිබඳව ඔබ මෙසේ හිතන්න පුළුවන්. මේ පිළිබඳව මා කියවූ පොත පත මේ වාගෙ පිළිතුරු යෝජනා කරල තියෙනවා. කෙනෙකුගේ දේශනයක දී මේ වාගෙ මතයක් ප්‍රකාශ වුණා මට මතකයි. මේ පිළිබඳව පෞද්ගලිකව මට නම් හැඟෙන්නෙ මේකයි, ගත යුතු මඟ කියල. ඒත් මට හිතෙන දේ වුනත් සම්පූර්ණයෙන්ම නිවැරදියි කියල මට ස්ථිරයෙන්ම කියන්න බැහැ. ඒ ඇයි? මා හරියි කියල හිතා ගත්ත බොහෝ දේ වැරදුන අවස්ථා තියෙනවා. එසේ නම් කුමක්ද නිවැරදි මඟ? ඒ ගැටළුව ප්‍රඥාවේ උල්පත අබියස එලෙස විමසා බලන්නට අප ඉගෙන ගත යුතුයි. සිතුවිලි තුළ නම්‍යතාවය පැවතීම යනුවෙන් මා අදහස් කරන්නේ එවැන්නක්. යමක් පිළිබඳ ඔබගේ මතය අසම්පූර්ණ බවට හා එය වැරදි සහගත විය හැකි බවට ඔබ තුළ ඇති අවංක පිළිගැනීම නම්‍යතාවයේ විශේෂ ලක්ෂණයක්. සිතුවිලි තුළ නම්‍යතාවය තුළින් සිදුවන්නෙ අසීමිත ගවේෂණ ක්ෂේත්‍රයට බලගතු ලෙස පිවිසීමක්. ජීවිතය පුරා මෙම නම්‍යතාවය රැකගතහොත් එමගින් බලය ලැබෙනවා ප්‍රඥාවේ ගැඹුර වෙතට කිමිදෙන්නට. එවැනි ආකල්පයක් ඔබ තුළ ඇත්නම් ප්‍රඥාවේ උල්පත විසින් අනුමත කරන නිවැරදි මඟ සොයා ගන්නට ඔබට ද හැකි වනු නිසැකයි.

(ඛලිල් ජිබ්රාන් කිවියාණන්ගේ "ඔබේ සිතුවිල්ල හා මගේ සිතුවිල්ල" නිර්මාණයෙන් උපුටා ගත් කොටසක් මා ඔබ ඉදිරියේ තබන්නට කැමතියි. එය සිංහලට පරිවර්තනය කළේ ලෙනාඩ් පීරිස් මිහිඳුකුලසූරිය සොයුරාණන් විසින්.) "ඔබේ සිතුවිල්ල සම්ප්‍රදාය නමැති පසෙහි ගැඹුරට මුල් ඇදුන ගසෙකි. මගේ සිතුවිල්ල අවකාශය තුළ සරන වලාවෙකි. එය බිඳු ගැන්වී දිය පාරකට හැරී සමුදුර තුළට ලාලිත ස්වරයෙන් ගලා බසී. ඉක්බිති එය වාෂ්ප වශයෙන් අහසට නඟියි. ඔබේ සිතුවිල්ල චණ්ඩ මාරුතයෙන් හෝ හෙණ පතිතයෙන් හෝ සලිත කළ නොහැකි බල පවුරෙකි. මගේ සිතුවිල්ල හැම අතටම පාවී යන ඒ පාවී යාමෙහි තුටු සුව විඳින සුමුදු තුරු පතෙකි. ඔබේ සිතුවිල්ල වෙනස් නොවන චිරන්තර දෘෂ්ටියකි. ඔබ වෙනස් කිරීමට එයට හෝ එය වෙනස් කිරීමට ඔබට හෝ නොහැක. මගේ සිතුවිල්ල නැවුම්ය. උදේ හවා එය විසින් මා ද මා විසින් එය ද සෝදිසි කෙරේ."

## එදිනෙදා ඇගේ හැපෙන වැඩ කොටස ඉතා හොඳින් ඉටු කරන්න.

මැවුම්කරුවාණන්ගෙන් අප එකිනෙකාට පැවරී ඇති විශේෂ දූතමෙහෙයක් තිබෙනවා. එය සාර්ථකව ඉටුකරනු සඳහා අප එකිනෙකා වෙත දානය කළ තලෙන්තු හෙවත් කුසලතාවයන් ද තිබෙනවා. අප එකිනෙකා වෙත පැවරී ඇති දූතමෙහෙය එකිනෙකා තුළින් ඉටුවීමයි, සාර්ථක ජීවිතයක රහස. කෙනෙකුගේ ශුද්ධවන්තභාවයේ රහසත් එයමයි. කෙනෙකුගේ ශුද්ධවන්තභාවය සමාජ පූර්ණත්වය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇතිකරනවා. එනිසා ප්‍රඥාවේ උල්පත තුළින් අප එකිනෙකාට පැවරී ඇති දූතමෙහෙය අප එකිනෙකා තුළින් ඉටුවීමයි, සමාජ ප්‍රගතියේ හා සමාජ විමුක්තියේ රහස. එනිසා ශුද්ධවූ ප්‍රභවය තුළින් අප එකිනෙකාට පැවරී ඇති විශේෂ දූතමෙහෙය සොයා හැඳින ගන්නෙ කොහොමද කියන එක වැදගත් ප්‍රශ්නයක්.

එදිනෙදා ඔබ සිටින තැන එදිනෙදා ඔබේ ඇගේ හැපෙන වැඩය ඉතා හොඳින් ඉටුකරන්නට පුරුදු වන්න. ධර්මයාණන්ගෙන් ඔබට පැවරී ඇති විශේෂ දූතමෙහෙය සොයා ගැනීමේ නිවැරදි මඟ එයයි. ක්‍රිස්තුස් වහන්සේ මෙලෙස පැවසුවා. "අල්ප දේ ගැන විශ්වාසි තැනැත්තේ මහත් දේ ගැනත් විශ්වාසි වෙයි. අල්ප දේ ගැන වංචනික තැනැත්තේ මහත් දේ ගැනත් වංචනික වෙයි." (ලූක් 16:10) එදිනෙදා කරන්නට සිදුවන පුංචි දෙයක් පිළිබඳව විශ්වාසවන්ත වෙනව නම් කැපවීමෙන් වගකීමෙන් එය ඉටුකරනව නම් ලොකු දෙයක් ගැන ද ඔහු විශ්වාසවන්ත බවයි, මිනිස් බව ගත් ධර්මයාණන් ප්‍රකාශ කළේ. එනිසා පුංචි දේ පිළිබඳව ඔබ විශ්වාසි වුවහොත් ධර්මයාණන් ඔබගේ මූලික දූතමෙහෙය ඉටුවන ජීවිතයක් කරා ඔබ ගෙන යනු නියතයි.

දිනපතා ඇගේ හැපෙන වැඩය ඉතා හොඳින් ඉටුකිරීම පිළිබඳව අප අබියස තබාගත යුතු පරමාදර්ශයක් ලෙස ලීසියහී සාන්ත තෙරේසා තුමිය හඳුන්වා දෙන්න පුළුවන්. එය පුංචිම දෙයත් මහා ප්‍රේමයකින් කිරීමක්. මනුෂ්‍යයා ලොකු දේවල් කරනවා පුංචි හෝ ප්‍රේමයකින් තොරව, නැතහොත් ඉතාම සිල්ලර ප්‍රේමයකින් යුතුව. ලීසියහී සාන්ත තෙරේසා තුමිය පුංචිම දෙයත් මහා ප්‍රේමයකින් ඉටු කළා. (කල්කටාවේ සාන්ත තෙරේසා තුමිය ද ඒ සත්‍යය උපරිමව ක්‍රියාවට නැගුවා.) ඒ පිළිබඳ එක උදාහරණයක් මා ඔබ ඉදිරියේ තබන්නට අදහස් කරනවා. එම කන්‍යාරාමයේ සිටි මහලු කන්‍යා සොයුරියකට උපස්ථාන කිරීමේ කටයුතු ඇය දේවස්ථානයට හා භෝජන ශාලාවට කැඳවාගෙන යාම් ඊම් ආදි කටයුතු භාර ගන්නට කිසිදු කන්‍යා සොයුරියක් කැමැත්තෙන් ඉදිරිපත් වූයේ නැහැ. එම කටයුතු කොපමණ හොඳින් ඉටුකළත් ඇයගෙන් චෝදනා අසන්නට සිදුවීමත් ඇයගෙන් ස්තුතියක් කිසිසේත්ම

නොලැබීමත් ඊට හේතුවයි. එහෙත් ලිසියහි තෙරේසා මාටින් සොයුරිය එය කැමැත්තෙන් භාර ගත්තා. ඒ කටයුතු එතුමිය මොන තරම් හොඳින් ඉටුකළා ද යන්න ඇයගේම මෙම වචනවලින් ඔබට සිතා ගන්නට පුළුවන්. "ඉතින් මා ගරු පේදුරු සහෝදරිය දිනපතා භෝජන ශාලාව වෙත කැඳවා ගෙන ගියේ කොතරම් ප්‍රේමයකින් ද කියතොත් මගේ ස්වාමින් වහන්සේවම (ජේසුස් ක්‍රිස්තුස් වහන්සේවම) මා එලෙස කැඳවාගෙන ගියත් ඊට වඩා හොඳින් ඒ කාර්යය කරන්නට නොහැකි වනු ඇත."

ලිසියහි සාන්ත තෙරේසා තුමියගේ මුළු ජීවිතයම විඳුම පිදුම, මිදුම ක්‍රියාවට නැගීමක්. ඇය කටුක දේ ප්‍රේමයෙන් විඳ දරා ගත්තා, ඇය දෙවිඳුන් අබියස හෙවත් ප්‍රේමයේ පුදසුන මත එය පිදුවා සියල්ලන්ගේ විමුක්තිය උදෙසා, එයින් මිදුම හෙවත් ගැළවීම උදා කරන්නට දායක වුණා. එතුමිය එක යුගයක පමණක් නොව සැම යුගයකම මහා ශුද්ධවන්තියක් වීමේ රහස මෙයයි. සිටින තැනම පිපෙන්නට ඇය අපට ඇරැයුම් කරනවා. අප තුළ යම් තරමකට හෝ පෙළඹීමක් තියෙනව, සිටින තැනින් පලා ගොස් වෙන තැනක පිපෙන්නට. ඊට හේතුව අප සිටින තැනමයි, අප දැරිය යුතු කුරුසිය බොහෝ විට ඇත්තේ. ළඟම ඉන්න අයට ප්‍රේම කරන එකයි වඩා අපහසු. ඔබගෙයි කියා ඔබ කියන ජීවිතය සැබවින්ම ඔබගෙම නොවෙයි. පරම සත්‍යය ධර්මකාය හෙවත් මැවුම්කරුවාණන් විසින් එය ඔබට දානය කර ඇත්තේ මුළු මිනිස් පවුල උසස් කරනු සඳහායි. එතුමන් විසින් බොහෝ දෙනා කැඳවන්නෙ එදිනෙදා සාමාන්‍ය වැඩකටයුතු තුළ ඉන්න තැනම පිපෙන ජීවිතයක් සඳහායි. හැම යුගයකම බහුතරයට ලැබෙන එම කැඳවීම පිළිබඳ පරමාදර්ශයක් ලෙස ලිසියහි සාන්ත තෙරේසා තුමිය හඳුන්වා දෙන්න පුළුවන්. අපගේ ජීවිතය සරු පසක් ඇති බිමක් කර ගන්නට නම් මෙම කරුණු ජීවිතයට අදාළ කර ගන්න එක හුඟක් වැදගත් වෙනවා.

සමාජ විමුක්තිය කෙරෙහි මහත් බලපෑමක් ඇති කරන විඳුම, පිදුම, මිදුම අප එකිනෙකා අපගේ ජීවිතයට අදාල කර ගන්නට උත්සාහ කළ යුතුයි. එය ද පුංචි දේ ගැන වඩා විශ්වාසී වීමක්. එය ඔබ ඉන්න තැනම පිපෙන්නට සලස්වනවා. ඔබ පැල්පතක සිටියත් රජ මැදුරක සිටියත් ඔබට දිනපතා විඳ දරා ගන්නට සිදුවන දුක් ගැහැට නින්දා අපහාස ආදිය ඔබගේ කරුමයක් ලෙස තව දුරටත් නොසිතා එය ඔබ සතු කැඳවීම හා දූතමෙහෙය ලෙස සලකා ප්‍රේමයේ නාමයෙන් ඒ විඳුම භාර ගන්නව නම් ඒ තත්ත්වයම අත්දකින අනෙක් අයගේ ද විමුක්තිය උදෙසා ප්‍රේමයේ පුදසුන මත එය පුදනව නම්, පෞද්ගලික ශුද්ධවන්තභාවය සඳහාත් සමාජ පූර්ණත්වය සඳහාත් එය අනුපමේය සේවයක් ඉටුකරනු නියතයි.

"අපේ මිහිකත උදෙසා දෙව් ලොව හාදුව දිනාගත් මේ කුඩා හදවතට මේ පිරිසිඳු ආත්මයට ආශිර්වාද වේවා! " ---- දූවිලි පිළිකුල් කිරීමටත් රත්තරන් ගැන එළවා යන්නටත් ඔහු ඉගෙන ගෙන නැත. ඔබේ හදවතට ඔහු තුරුල් කරගෙන ඔහුට ආශිර්වාද කරන්න. දහසක් හරස් පාරවල් ඇති මේ රටට ඔහු පැමිණ සිටී. ---- පහළ දිය රැළි දරුණු වෙතත් ඉහළින් එන හුස්ම ටික අවුත් ඔහුගේ රුවල් පුරවා සමාදානයේ තොටුපල කරා ඔහු ගෙන යේවා ! යි ඔහුගේ හිසට අත තබා යාච්ඤා කරන්න."

(*"Crescent Moon"* - 'අඩ සඳ', රවින්ද්‍රනාත් තාගෝර්)
(අනුවාදය, හෙට්ටිගේ බැස්ටියන්)